# සංඛ්‍යාන සරණීය

බුද්ධිමය ගවේෂණයක සෞන්දර්යාත්මක ආඛ්‍යානය

දෙවන වෙළුම දෙවන කලාපය | 2022 මාර්තු

# තාක්ෂණය මුසු තාරුණ්‍යය සංඛ්‍යානමය ඇසින්



සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

පළමු වෙළුම
පළමු කලාපය
(මැයි - 2020)

පළමු වෙළුම
දෙවන කලාපය
(අප්‍රේල් - 2021)

දෙවන වෙළුම
පළමු කලාපය
(සැප්තැම්බර් - 2021)

දෙවන වෙළුම
දෙවන කලාපය
(මාර්තු - 2022)

**ISSN 2756-9012**

ප්‍රකාශනය
විෂය සංගමය
සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



සංඛ්‍යාන සරණිය

**"තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්"**

# පටුන


**12** තාක්ෂණය මුසු තාරුණ්‍යය සංඛ්‍යානමය ඇසින්

**16** Prisoned Mind

**17** තාක්ෂණික කල්පිතය
පරිපථයෙන් පිබිදෙන සාතීය රේඛාව

**18** Sri Lankan Youth & Their Exposure to the Technology

**20** තාක්ෂණික සමීකරණය

**22** The Lancet

**24** තාක්ෂණයේ උපනතිය
තාක්ෂණයේ පුරෝකථනය

**27** RACE

**28** තාක්ෂණීකරණයට ලක් වූ තාරුණ්‍යයේ
සමාජ මාධ්‍ය හරඹය

**31** Digital වෙන ගමන්

**32** Online තුළ සිරගත මිනිස්කම

**35** සංඛ්‍යානයේ තාක්ෂණික සබැඳියාව

**36** සංඛ්‍යානයෙන් දිවිමග දිනුවෝ

**42** නව නිපැයුම් හා අපේ තරුණ පරපුර

**44** දැනුමට බිඳක්

**47** Puzzle

**48** සිහිනයට අත්වැලක් උපකාරක සම්මන්ත්‍රණය
ප්‍රශ්න පත්‍රය

**58** පිළිතුරු පිටුව

**60** ස්ටැට් පොඩ්ඩා

# සඟරා සංස්කාරක කමිටුව

### සඟරා උපදේශක



අධ්‍යයනාංශ ප්‍රධාන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය
තනූජා සිල්වා මිය

### ජ්‍යෙෂ්ඨ සඟරා සංස්කාරක



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
බුද්ධි සෙනෙවිරත්න මිය

### සහාය සඟරා සංස්කාරක



සහාය කථිකාචාර්ය
ඉමල්ෂා නිමිතරා මෙනවිය

### සහාය සඟරා සංස්කාරක



සහාය කථිකාචාර්ය
චතුරිකා එරන්දි මෙනවිය

### කනිෂ්ඨ සඟරා සංස්කාරක



රශ්මි ජයකොඩි

### කනිෂ්ඨ උප සඟරා සංස්කාරක



නිම්රියා විජේරත්න





## කමිටු සාමාජිකයන්



ගයේෂි ලියනගේ



කුමුදිලී රූපසිංහ



සඳරේණු අබේවික්‍රම



සෙව්වන්දි හේරත්



සඳුන් බුද්ධික

## උපදේශකතුමියගේ පණිවිඩය



**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය තනූජා සිල්වා මිය**

ලෝකය තාක්ෂණීකකරණය වීමත් සමග නූතන තරුණ පරපුර තාක්ෂණය හා සබැඳෙමින් ඊට අනුගත චින්තනයක් ද චර්යා රටාවක් ද නිර්මාණය කොට ගෙන තිබේ. නවීන මිනිසාගේ ජීවිතයට තාක්ෂණය අතිශයින් වැදගත් වනුයේ එය ඔහුගේ ජීවිතයේ සෑම ක්‍රියාවක් ම වේගවත්, පහසු සහ කාර්යක්ෂම කිරීමට හේතු වන නිසා ය. තාක්ෂණයෙන් සන්නද්ධ වූ මිනිසා මේ වන විට කෘත්‍රිම බුද්ධිය සහිත නිර්මාණ බිහිකිරීමට ද ක්ෂණයෙන් මුළු ලොව ම විනාශ කිරීමට හැකි අවිආයුධ නිපදවීමට ද සමත් වී ඇත. තාක්ෂණික දියුණුවේ ප්‍රතිලාභ වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මාන්තය, සන්නිවේදනය යනාදි විවිධාකාර ක්ෂේත්‍රවලට පැතිර ගොස් හමාර ය. අනෙක් අතට නූතන තරුණ පරපුරේ චින්තනයේ සියලු අවකාශ තාක්ෂණය විසින් හිත්පිත් නොමැති ව අත්පත් කරගෙන ඔවුන් ව ඔවුනට ම ආවේණික වූ ලෝකයක හුදෙකලා කර අතරමං කර ඇත. මෙම තත්ත්වය මත නූතන තරුණ පරපුරට නවීන ලෝකය ජයග්‍රහණය කළ හැකි වන්නේ තාක්ෂණයට ඇබ්බැහි වීමෙන් නොව එය මනාව කළමනාකරණය කිරීමෙන් පමණක් ම ය.

"තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්" විවරණය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන්ගේ නිර්මාණ එකතුවක් ලෙස "සංඛ්‍යාන සරණිය" දෙවන වෙළුමෙහි දෙවන කලාපයෙන් එළිදැක්වීමට ලැබීම පිළිබඳ ව මම ඉමහත් සතුටට පත් වන බව සනිටුහන් කිරීමට කැමැත්තෙමි.

රසවත් නිර්මාණ තුළින් බුද්ධිමත් පාඨක සවිඥානය අවදි කිරීමට ප්‍රයත්න දැරූ සියලු ම කතුවරුන්, ජ්‍යෙෂ්ඨ සඟරා සංස්කාරක ඇතුළු සංස්කාරක කමිටු සාමාජික මණ්ඩලයට මම හෘදයාංගම ස්තුතිය පුද කරමි. කියවීමට රුචිකත්වයක් ඇති පාඨක ප්‍රජාව වෙත විවිධ මානයන් ඔස්සේ බිහි වන නව නිර්මාණ සපිරි සංඛ්‍යාන සරණිය අඛණ්ඩ ව රැගෙන යාමට ප්‍රයත්න දරන සියලු දෙනාට ධෛර්යය ශක්තිය ලැබේවා යැයි මම ප්‍රාර්ථනා කරමි!





## ජ්‍යෙෂ්ඨ සඟරා සංස්කාරක සටහන



**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බුද්ධි සෙනෙවිරත්න මිය**

සෑම සමාජයක ම තරුණ ප්‍රජාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. නැවුම් සිතිවිලිවලින් යුක්ත අනාගතය විනිවිද දැකිය හැකි, තම රට ජාතිය කෙරෙහි ඇල්මක් දක්වන තරුණ තරුණියෝ, ඔවුන්ගේ නව චින්තනය හා හැකියාවන් නවීන තාක්ෂණය සමග මුසු කරමින් නව නිපැයුම් ලෝකයා හමුවේ සම්මුඛ කරති. ඒ ඔස්සේ තම මව්බිමට, ලෝකයට මෙන් ම විශ්වයේ අනාගතයට ශුභවාදී මෙහෙවරක් සිදු කිරීමට ඔවුන් සතු අපූර්ව ශක්තිය විදහා දක්වයි. තාරුණ්‍යය සතු ජව සම්පන්න සිතිවිලි සහ හැකියාවන් මුල සිට ම නිවැරදි ලෙස හඳුනා ගැනීම, අත දීම සහ මඟ පෙන්වීම තුළින් රටකට ඉතා වැඩදායී මෙන්ම නිරවුල් මනසකින් යුත් සාර්ථක තරුණ ප්‍රජාවක් බිහි කිරීමට අවස්ථාවක් පවතී. මෙම ප්‍රස්තුතය මූලික කරගෙන "තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්" යන තේමාව ඔස්සේ සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයේ විෂය සංගමය මඟින් ප්‍රකාශයට පත් කරන "සංඛ්‍යාන සරණිය" සඟරාවේ දෙවන වෙළුමෙහි දෙවන කලාපය ඔබ අතට පත් කරන්නේ ඉමහත් සතුටිනි.

පුරාතනයේ දියුණු ශිෂ්ටාචාරවල විසූ මිනිසාගේ නිර්මාණ අදටත් විස්මය ගන්වන සුළු ය. අපගේ මුතුන් මිත්තන් විසින් ඉදිකරන ලද යෝධ දාගැබ්, වාරි මාර්ග පද්ධති, නගර මෙන් ම කලාව, භාෂාව, දේශීය වෛද්‍ය ක්‍රමවේද ඉතාමත් වටිනා නිපැයුම් ය. එවන් අභිමානවත් පරපුරකින් පැවත එන නූතන තාරුණ්‍යය බොහෝ කුසලතාවලින් සන්නද්ධ ය. කොවිඩ් - 19 වසංගතය නිසා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ බොහෝ කටයුතු සිදු කර ගැනීමට නූතන තරුණ ප්‍රජාවට සිදු විය. එහි අතුරු ඵලයක් වශයෙන් වෙන කවර කාලයකටත් වඩා වේගයෙන් යාවත්කාලීන දැනුමෙන් පෝෂණය වීමට ඔවුනට හැකි විය. විවිධ ක්ෂේත්‍රවල නව අවශ්‍යතාවන් මේ හා සමගාමී ව ඇති වූ අතර ඒවාට තාක්ෂණික නවෝත්පාදන හරහා විසඳුම් දීමට ඇතැම් තරුණ තරුණියෝ සමත් වූහ. සමාජ ජාල භාවිතය ද මෙම වකවානුවේ කැපී පෙනෙන ලෙස වර්ධනය වෙමින් ඇත. තාක්ෂණික වූ තාරුණ්‍යය වෙතින් තාරුණ්‍යයේ සොඳුරු හැඟුමන්, අව්‍යාජ සමාජ සබඳතා ගිලිහෙමින් යන බවක් ද දිස් වේ. නූතන තරුණ පරම්පරාව තාක්ෂණය සමග මුසු වෙමින් සිදු කරන මෙම ගනුදෙනුවේ යථාරූපය සෞන්දර්යාත්මක දෘෂ්ටි කෝණයකින් තම නිර්මාණ ඔස්සේ සියුම් ව කියවන්නන් හට සන්නිවේදනය කරලීමට අප සිසු දරුවන් මෙවර කලාපයේ දී ද සිදුකර ඇති සාර්ථක උත්සාහය අගය කළ යුතු ම ය.

අවශ්‍ය සෑම මොහොතක දී ම මෙම සඟරාවේ සාර්ථකත්වය උදෙසා අවශ්‍ය උපදෙස් හා නිසි මඟපෙන්වීම ලබාදුන් සඟරා උපදේශක ලෙස කටයුතු කරන අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය එච්. පී. ටී. එන් සිල්වා මහත්මිය කෘතවේදී ව සිහිපත් කරමි. පසුගිය කලාපයේ උපදේශකතුමිය ලෙස කටයුතු කෙරූ හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය ඩී. පී. කේ මානෙල් මහත්මිය ඇතුළු අධ්‍යයනාංශයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සියලු ම දෙනා විසින් ලබා දුන් සහායට ස්තූතිවන්ත වෙමි. අනේකවිධ බාධක හමුවේ ඉතාමත් කෙටි කලකින් මෙවර කලාපය ඔබ අතට පත් කිරීමට හැකියාව ලැබුණේ මා සමග එක් ව කටයුතු කළ තරුණ කණ්ඩායමක කැපවීම සහ එකමුතුකම නිසා ම ය. කනිෂ්ඨ සඟරා සංස්කාරක ලෙස කටයුතු කරන රශ්මි ජයකොඩි ඇතුළු සඟරා සංස්කාරක කමිටුවේ සියලු ම සාමාජිකයන්ට මම ස්තූති කරමි. සමාජ සංඛ්‍යාන විෂය සංගමයේ සභාපති ලෙස කටයුතු කරන ශිෂ්‍ය චාන් සුරේන්ද්‍ර ඇතුළු සංගමයේ සියලුම සාමාජිකත්වයට ද අවශ්‍ය මොහොතේ දී මෙම සඟරාවේ ගුණත්වය වැඩි දියුණු කිරීමට දායකත්වය සැපයූ සිසු දරුවන් ද සෙනෙහසින් සිහිපත් කරමි. මෙවර කලාපය සඳහා නිර්මාණ දායකත්වයෙන් සහයෝගය දැක් වූ සියළුම කතුවරුන් හට සඟරා සංස්කාරක කමිටුව වෙනුවෙන් ස්තූතිය සහ සුභ පැතුම් එක් කරමි.

තාක්ෂණය යනු මෙවලම් සමූහයක එකතුවකි. එකී තාක්ෂණයට ජීවය ලබා දෙන්නේ මිනිසා ම ය. තාක්ෂණයේ හොඳ හෝ නරක තීරණය කෙරෙන්නේ ද මිනිසාගේ ක්‍රියාවන් මත ම ය. එම කරුණ තරුණ ප්‍රජාව විසින් මැනවින් අවබෝධ කර ගත යුතු යුගයක "තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්" එම චින්තනය සවිබල ගැන්වීම උදෙසා සියුම් සත්කාරයක් ම වේවා! තාක්ෂණය මුසු ආදරණීය තාරුණ්‍යයක් !

## කණිෂ්ඨ සඟරා සංස්කාරක සටහන



කණිෂ්ඨ සඟරා සංස්කාරක, රශ්මි ජයකොඩි

තාරුණ්‍යයේ නිසග කුසලතා සංඛ්‍යානමය දෘෂ්ටි කෝණයෙන් සමාජයට මුදාහරින තෝතැන්න වන සංඛ්‍යාන සරණියෙහි කනිෂ්ඨ සඟරා සංස්කාරක ලෙසින් පාඨක ඔබ අමතන්නට අවසර යි.

බුද්ධිමය ගවේෂණයක සෞන්දර්යාත්මක ආඛ්‍යානය, සංඛ්‍යාන සරණිය සඟරාවේ දෙවන වෙළුමෙහි දෙවන කලාපය "තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්" යන තේමාව පාදක කරගනිමින්, ඉතාමත් කෙටි කලක දී වුව ද ප්‍රකාශයට පත් කරනු ලබන්නේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙනි.

මෙවර කලාපය ඔබ අතට පත් කිරීමේ දී ආරම්භයේ සිට අවසානය දක්වා උපදේශනයෙන් මඟපෙන්වූ අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය තනූජා සිල්වා ආචාර්යතුමිය හට කෘතඥතාව පිරි ස්තූතිය පුද කර සිටිමි. එසේ ම පසුගිය කලාපයේ උපදේශකතුමිය ලෙස කටයුතු කෙරූ හිටපු අධ්‍යයනාංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කාන්ති මානෙල් ආචාර්යතුමියත් පළමු වෙළුමෙහි ජ්‍යෙෂ්ඨ සඟරා සංස්කාරක කථිකාචාර්ය දිලාමි ඉලංගසේකර ආචාර්යතුමියත් ලබා දුන් සහයෝගය මේ අවස්ථාවේ දී සිහි කරන්නේ ද හෘදයාංගම ගරුත්වයෙනි. ඉතාමත් කෙටි කලකින් මෙවර කලාපය ඔබ අතට පත් කිරීමේ කර්තව්‍යයේ දී නිබඳ අපගේ සෙවනැල්ල වෙමින් බාධකයන්ට අභියෝග කරමින් නැඟී සිටීමට ශක්තිය ලබා දුන් සඟරා සංස්කාරක කමිටුවේ ජ්‍යෙෂ්ඨ සඟරා සංස්කාරක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බුද්ධි සෙනෙවිරත්න ආචාර්යතුමිය හට හදේ ගලනා සෙනෙහස පුද දෙන්නේ හෘදයාංගම ගරුත්වයෙනි. තවද අප පසුපස හිඳිමින්, අඩුපාඩු සකසා දෙමින් සහයෝගය ලබා දුන් සහාය කථිකාචාර්යවරියන් වන ඉමල්ෂා නිමිතරා සහ චතුරිකා එරන්දි ආචාර්යතුමියන් දෙපළත් කෘතවේදී ව සිහිපත් කරමි. එ මෙන් ම නිරන්තරයෙන් සංඛ්‍යාන සරණිය වටා හිඳිමින් අප සැවො ම පෝෂණය කරන්නා වූ අධ්‍යයනාංශයේ සියලු ම ආචාර්යවරුන්ටත්, අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් සඟරා සංස්කාරක කමිටුවේ කෘතඥතාව පිරි ස්තූතිය මෙසේ පුද කර සිටිමි.

තව ද නිරවුල් හා හරවත් වෙළුමක් පාඨක ඔබ වෙත ඉදිරිපත් කරන්නට මා හා නිරන්තරයෙන් රැඳී සිටි සඟරා සංස්කාරක කමිටුවේ සාමාජික සාමාජිකාවන් ලබා දුන් සහයෝගයට ස්තූතිවන්ත වෙමි. එසේ ම අධ්‍යයනාංශ විෂය සංගමයේ සභාපති චාන් සුරේන්ද්‍ර ඇතුළු සියලු ම සාමාජිකයින් හා මෙවර කලාපය වෙත තම නිර්මාණයන්ගෙන් සහයෝගය ලබා දුන් සියලු ම ආචාර්යවරුන්ටත් මාගේ සහෝදර සහෝදරියන්ටත් අවශ්‍ය සෑම මොහොතේ දී ම උදව් උපකාර කළ සියලු ම දෙනාටත් මගේ කෘතවේදීත්වය මෙසේ පුද කර සිටිමි.

නවීන තාක්ෂණික ලොවක අඳුරේ අතපත ගාමින් සිටින තාරුණ්‍යය, ආලෝකය කරා ගෙනයාමට "තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්" යන තේමාව රැගත් මෙවර කලාපය උපස්ථම්භයක් ම වේවා!





*"Humans are the reproductive organs of technology"*

*- Kevin Kelly -*










සත්ත්ව ලෝකයේ සංකීර්ණතම ජීවියා මිනිසා වේ. අප ජීවත්වන විසි එක් වන ශතවර්ෂය වන විට ලෝකය තාක්‍ෂණයේ හිණිපෙත්තට ම යාමත් සමග හෝමෝ සේපියන්ස් සේපියන්ස් මානවයා හෝමෝ ටෙක්නිකස් හෙවත් තාක්‍ෂණික මිනිසකු බවට පත්වෙමින් සිටියි. වර්තමාන තරුණ පරපුර එදා මුතුන්මිත්තන් සිදුකළ ප්‍රාථමික මට්ටමේ පැවති බොහෝ කාර්යයන් තාක්‍ෂණය තුළින් වැඩිදියුණු කරමින් සංකීර්ණ වූත් කාර්මීකරණය වූත් ලොවක් බිහිකරමින් පවතී. කාර්මික විප්ලවයත් සමග ඇති වූ පුනරුදයත්, කාලානුරූප ව ඇති වූ ගෝලීයකරණය හා නාගරීකරණ ක්‍රියාවලීන් හරහා මුළු ලොව ම එක ම විශ්ව ගම්මානයක් බවට පත් කිරීමට තාක්‍ෂණය අද වන විට සමත් ව ඇත.

වර්තමානය වන විට තාක්‍ෂණය කෙරෙහි තරුණ ප්‍රජාවගේ වැඩි නැඹුරුවක් දක්නට ලැබෙන බව නොරහසකි. එ මෙන් ම මෙම තාක්ෂණික නැඹුරුවත් සමග නව සොයාගැනීම්, දැනුම ගවේෂණය වැනි අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ලෝකය උඩුයටිකුරු කිරීමට තරුණ ප්‍රජාවට හැකි වී ඇත. විශේෂයෙන් ම වර්තමානයේ තාක්ෂණයෙන් පොහොසත් වූ තරුණ පරපුර කෘත්‍රිම බුද්ධිය සහිත නිර්මාණ එළිදක්වමින් සිටියි. ස්වයංක්‍රීය ව ධාවනය වන මොටර් රථ, මිනිසාට සහාය වන රොබෝවරුන් ඇතුළු නව නිර්මාණයන් ලොවට දායාද කිරීමට ඔවුන් අද වන විට පෙළඹී ඇත. තව ද පෘථිවිය අභිබවමින් මුළු විශ්වය පුරා තාක්ෂණික දැනුම විහිදුවා හැරීමට නූතන පරපුරට හැකි වී ඇත. අභ්‍යවකාශ ගවේෂණයන්ට පමණක් නො ව වෙනත් ග්‍රහලෝකයන් හි ජීවය ඇති කරවීමට පවා තරුණ කණ්ඩායම් මේ වන විට තාක්ෂණය යොදා ගනිමින් සිටියි. තරුණ ප්‍රජාව තුළ මෙම “Mars Generation” සංකල්පය අද වන විට වඩාත් ප්‍රචලිත ව ඇත. එ නයින් එදා ග්‍රහලෝක දේවත්වයෙන් සලකා වන්දනාමාන සිදු කළත් නූතන පරපුර යල්පැන ගිය අදහස්වලින් මිදී තාක්ෂණික දැනුම තුළින් සිදුකරන විප්ලවය විශ්වයේ ම හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි යි. නමුත් තාක්ෂණයෙන් තොර ව ජීවත් විය නොහැකි මට්ටමට වර්තමාන පරපුර තාක්ෂණය සමග පැටලුණු නූල් බෝලයක් බවට පත් වීම තරමක ඛේදවාචකයකි. එක් පසකින් මානුෂියත්වයෙන් පිරිහී ගිය රොබෝ පරපුරක් නිර්මාණය කිරීමට ද සීමා විරහිත ව අනිසි දේ පසුපස හඹා යන පරපුරක් නිර්මාණය කිරීමට ද තාක්ෂණය අද හේතු වී ඇත. තව ද යන්ත්‍ර සූත්‍ර මුල් කරගත් රැකියා රැල්ලක් බිහි වීම හරහා රෝගී අනාගතයක මංසලකුණු ද නිර්මාණය වෙමින් පවතී. භෞතික විද්‍යාඥ නිව්ටන්ට අනුව සෑම ක්‍රියාවකට ම ඒ හා සමාන වූ ද ප්‍රතිවිරුද්ධ වූ ද ප්‍රතික්‍රියාවක් හටගනී. තාක්‍ෂණයේ ඇති වූ විප්ලවීය බලපෑම්වලට ද මෙම නියමය අදාළ වේ. මේ අනුව තාරුණ්‍යය හා බැඳුණු විවිධ අංශ කෙරෙහි තාක්ෂණයේ මැදිහත්වීම කෙබඳු දැයි විමසා බැලීම වැදගත් වේ.

වර්තමාන ලෝකයේ තාක්ෂණය හා ඒකාබද්ධ වූ සුවිශේෂී අංශයක් ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය සැලකිය හැකි ය. වසංගත තත්ත්වය හමුවේ වුව ද අධ්‍යාපනය නිසි ලෙස පවත්වා ගෙන යාම සඳහා තාක්ෂණයෙන් විශාල දායකත්වයක් ලබා දෙන බව අපි හොඳින් ම දන්නෙමු. මෙහිදී මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකිරීම, නව අධ්‍යාපන ක්‍රම හඳුන්වාදීම ආදිය මගින් වර්තමානය වන විට එයින් උපරිම ඵල නෙලා ගැනීමට තරුණ පරපුරට හැකි වී ඇත. එ මෙන් ම තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනයත් සමග ලොව පිළිගත් උසස් අධ්‍යාපන ආයතන ස්වකීය පාඨමාලා සඳහා විශ්වීය දොරගුළු විවර කර ඇත. එමගින් ලොව පුරා දැනුමින් සන්නද්ධ තරුණ පරපුරක් බිහිවෙමින් පවතී. පසුගිය වසර කිහිපය දෙස බලන විට ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ට සාපේක්ෂ ව තරුණ තරුණියන්ගේ (අවු.15-30) පරිගණක සාක්ෂරතාව සහ ඩිජිටල් සාක්ෂරතාවය 50% ඉක්මවා ඇත (Computer Literacy Statistics, 2020). පරිගණක - මූලික අධ්‍යාපන ක්‍රමය හරහා දුරස්ථව සිට ඉගෙනුම් හා ඉගැන්වීමේ අභියෝගය සාර්ථක ව විසඳාගත්ත ද, විෂය කරුණු ශිෂ්‍යයාට ප්‍රායෝගික ව සමීප කරවීමට තාක්ෂණය තවමත් අපොහොසත් වී ඇත. තව ද මෙම නව අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ විෂය දැනුමට පරිබාහිර වූ තාරුණ්‍යයේ සොඳුරු අත්දැකීම් ඔවුන්ගේ ජීවිතවලින් ගිලිහී යමින් පවතියි.

තාක්ෂණය කෙරෙහි තරුණ පරපුරෙහි මැදිහත්වීම පිළිබඳ විමසීමේ දී සෞඛ්‍යය අංශය විශේෂයෙන් ම සඳහන් කළ යුතු ය. වසංගත තත්ත්වයන්ට සාර්ථක ව මුහුණදීම සඳහා නව ඖෂධ, නව සෞඛ්‍යය උපකරණ ලොවට හඳුන්වා දෙමින් වඩාත් නිරෝගී ලොවක් ඇති කිරීමට ද යහපත් සෞඛ්‍ය පද්ධති ප්‍රවර්ධනයට ද තාක්ෂණය ඉවහල් කරගැනීමට තරුණ ප්‍රජාව පෙළඹී ඇත. මෙහි ලා Multi Dimentional Thinking නිර්මාණය කිරීම තාක්ෂණයේ මෙන් ම වෛද්‍ය විද්‍යාව තුළ ද තාරුණ්‍යයේ මැදිහත්වීමට කදිම නිදසුනකි. ශ්‍රී ලංකාව තුළ ද කොවිඩ් මර්දන ව්‍යාපෘති සඳහා තරුණයින්ගේ මැදිහත්වීම කැපී පෙනෙන්නකි. මෙහි ලා නැනෝ තාක්ෂණික මුඛ ආවරණ නිර්මාණය, විෂබීජ නාශක බඳුන් නිර්මාණය, කොවිඩ් ප්‍රතිකාර සඳහා නව යන්ත්‍ර නිෂ්පාදන මෙන් ම ආසාදිතයන් හා ආශ්‍රිතයන් හඳුනාගැනීම සඳහා නව ජංගම දුරකථන යෙදවුම් නිර්මාණය කිරීම වැනි අවස්ථා රැසක් සඳහා තරුණයන්ගේ මැදිහත්වීම පසුගිය කාලය තුළ දැකගත හැකි විය. එපමණක් ද නොව නව කොවිඩ් ප්‍රභේද හඳුනාගැනීමට මෙන් ම නව ප්‍රතිකාර හඳුන්වාදීමට ද ලාංකීය තරුණ විශේෂඥයින් මේ වන විට සමත් වී ඇත. මීට අමතර ව සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් මිදී රෝගියා වෛද්‍යවරයා වෙත යොමු වීම වෙනුවට මාර්ගගත ක්‍රමවේද හරහා වෛද්‍යවරයා සමග සම්බන්ධ වීම, ඇතැම් රෝග සඳහා තමන්ට ම ප්‍රතිකාර කරගැනීමට හැකි වන පරිදි දැනුම එක්රැස් කරමින් ගොඩනැගූ ක්‍රමවේද කෙරෙහි

තරුණ ප්‍රජාව යොමුවීමේ ප්‍රවණතාවක් ද පවතී.

මිනිසා මුල් කරගත් කාර්යයන් යන්ත්‍ර සූත්‍රවලට භාර දෙමින් බොහෝ රැකියා අංශවල කාර්යයන් පහසු කරමින් ඉහළ ආර්ථික සංවර්ධනයක් වෙත ළඟා වීමට ද තාක්ෂණය ඉවහල් වී ඇත. විශේෂයෙන් ම තාක්ෂණික දැනුමෙන් පරිපූර්ණ තරුණයන්ට රැකියා සඳහා වැඩි ඉල්ලුමක් ද මේ වන විට නිර්මාණය වෙමින් පවතී. එ මෙන් ම මාර්ගගත වේදිකා හරහා ව්‍යවසාය විසඳුම් ඉදිරිපත් කිරීමට තාරුණ්‍යයේ වැඩි නැඹුරුවක් පවතී. පාරම්පරික රැකියා සම්ප්‍රදායෙන් මිදී නව මාවත් සොයා යමින් ශක්තිමත් ආර්ථිකයකින් හෙබි තරුණ පරපුරක් බිහි කිරීමට තාක්ෂණය ඉවහල් වී ඇත.

යෙදුම් මෘදුකාංග ඔස්සේ එම සේවා සපයන ආයතන හා සම්බන්ධ වෙමින් තම ප්‍රවාහන අවශ්‍යතා සිදු කිරීමටත්, විද්‍යුත් වාණිජ වෙබ් අඩවි හා සම්බන්ධ වී මාර්ගගත සාප්පුකරණයේ යෙදීමටත් තරුණ ප්‍රජාව වැඩි වශයෙන් නැඹුරුතාවක් දක්වයි. ප්‍රවාහනය, සංචාලන යෙදවුම් (Navigation Systems) ප්‍රවාහන කටයුතු පහසු කරගැනීම සඳහා යොදා ගැනීම හා දුරස්ථ ව වැඩ කිරීම (Remote Work) වැනි පහසුකම් රැසක් තාක්ෂණය හරහා තරුණ පරපුර ලෙස අප අත්විඳිමින් සිටිමු. එ පමණක් ම නොව තාක්ෂණය මුල් කරගනිමින් ශ්‍රී ලංකාවේ තරුණයින් පිරිසක් විසින් නිපද වූ 'වේගා' මෝටර් රථය ශ්‍රී ලංකාවේ තාක්ෂණික අනාගතයේ සුබ ලකුණක් ලෙස දැක්විය හැකි ය.




කෘෂිකාර්මික අංශය තුළ ද ගෝලීය ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දෙමින් ආර්ථිකය සවිබල ගැන්වීමට ද හරිත චින්තනය තවදුරටත් ප්‍රචලිත කරවීමට ද නව තාක්ෂණය ඉවහල් වී ඇත. සාම්ප්‍රදායික ක්‍රම වෙනුවට නූතන තරුණ පරපුර තුළ ස්වයංක්‍රීය ට්‍රැක්ටර්, අස්වනු සංවේදක යොදා ගැනීම, VRT හා SWATH පාලන තාක්ෂණ ශිල්පක්‍රම යොදා ගැනීම, ජංගම දුරකතන යෙදුම් භාවිතයෙන් වාරිමාර්ග පද්ධති පාලනය හා බෝගවල ගුණාත්මකබව සෙවීම වැනි ක්‍රමවේද ඔස්සේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පෙරළියක් සිදු කිරීමට තාක්ෂණය මේ වන විටත් මග පාදමින් සිටියි. මෙහිදී වැඩි කාලයක්, වැඩි ශ්‍රමයක් වැය කරමින් එදා සිදු කළ කාර්යයන් අද කෙටි කාලයක් හා අවම ශ්‍රමයක් වැය කරමින් සිදු කර ගැනීමට තරුණ පරපුර විසින් නව තාක්ෂණය යොදාගනියි. එදා ගමේ තේ දලු නෙලූ කතකගේ දියණියක් අද තාක්‍ෂණයේ උපරිම ඵල නෙලා ගනිමින් තේ දලු නෙලීම සඳහා සකසුරුවම් යන්ත්‍රයක් නිර්මාණය කිරීම සඳහා පෙළඹීමට හැකි ය. එසේත් නැතිනම් තේ දලු අපනයනය සඳහා තාක්ෂණය ඉවහල් කර ගැනීමට ද හැකි ය. නමුත් තාක්ෂණය හමුවේ රැකියා වියුක්තියට ද යම් තරමකින් අත වැනීමක් සිදු කරයි. තරගකාරී ආර්ථික රටාවන් තුළ මානුෂීයත්වයට ඇත්තේ ඉතා සුළු ඉඩකි. ඉල්ලුමට සරිලන සැපයුමක් ඉදිරිපත් කරමින් ස්ථාවර ආර්ථිකයක් පවත්වා ගැනීමෙහි ලා කාර්යය පහසු කරන යන්ත්‍ර සූත්‍ර හා නව තාක්ෂණික ශිල්ප ක්‍රම වෙත යොමු වීමේ දී සුළු සේවක රැකියා අවස්ථා ගිලිහී යාම තාක්ෂණයේ අයහපත් පැතිකඩකි. අනෙක් අතට තාක්ෂණික ක්‍රමවේදවලට යොමුවීම හරහා කෘෂිකර්මය හා වෙනත් රැකියා ආශ්‍රිත සංස්කෘතීන් හා සිරිත්විරිත් ගිලිහී යාම ද මෙහි ලා තාක්ෂණයේ තවත් අඳුරු පැතිකඩකි. රැකියා මුල් කරගත් ජන කවිය හා සම්ප්‍රදායන් මේ අනුව සමාජයෙන් ක්‍රමික ව තුරන් වී යනු ඇත.

තරුණ පරපුර වූ කලී සමාජ මාධ්‍ය හා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ තාක්ෂණික දියුණුව බහුල ව ම භාවිතයට ගැනෙන පිරිසකි. ලොව ම එක මිටකට ගනිමින් මුළු ලොවෙහි ම තතු එක් ක්‍ෂණයකින් තමා වෙත ලබා ගැනිමට හැකි වන පරිදි තාක්ෂණය පවා අද වෙනස්කම්වලට ලක් ව ඇත. සමාජ මාධ්‍ය තුළ තම පෞද්ගලිකත්වය විවර කරමින් ආදරය, විශ්වාසය බිඳවැටුණු නොයෙකුත් අවස්ථා දැකගත හැකි ය. පවුල් සබඳතා, සමාජ සබඳතා බිඳවැටෙමින් තාක්ෂණය කෙරෙහි තරුණ පරපුර ඇබ්බැහිවීම අද වන විට ව්‍යවසනයක් බවට පත් ව ඇතත් නව සබඳතා ගොඩනගා ගැනීමටත් දුරස්ථ ව සිටින හිතවතුන් සමඟ සම්බන්ධ වීමටත් තාක්ෂණය ඉවහල් වී ඇති බව සඳහන් කළ යුතු ය. නමුත් තාක්ෂණය පමණක් මුල් වූ සමාජයක් බිහි වීම මානුෂිකත්වයෙන් තොර සමාජයකට මඟපෙන්වන්නක් බව ආදි මුතුන්මිත්තන්ගේ අදහස යි. කීබෝඩ් විරුවන් ලෙසින් කටයුතු කරමින් ආගමක්, සංස්කෘතියක්, සදාචාරයක් නොමැති ඕපපාතිකයන් ලෙස සමාජය විවේචනය කිරීමට යොමු වීම සමාජ පිරිහීමක් දනවන්නකි. එහෙත් ඵලදායී ව තාක්ෂණය යොදා ගනිමින් සමාජය තුළ මානුෂීයත්වය වැපිරීමට ද කටයුතු කළ අවස්ථා සමාජය තුළින් ම දැකගත හැකි ය. තව ද කලාව, භාෂාව, සෞන්දර්යය විෂයෙහි ලා තරුණ ප්‍රජාව නව තාක්ෂණය යොදාගැනීම තුළ නව රසවින්දනයන් ලොවට එළිදැක්වීමටත්, ලොව නව නිර්මාණ සඳහා විවර කිරීමටත් හැකිවීම තරුණ තරුණයින් ලෙස අපට සතුටු විය හැකි කරුණකි.





මෙම තාක්ෂණික විප්ලවය අනාගත ලෝකය තව තවත් වර්ණවත් කිරීමටත්, ඇතැම් විට ලෝකය විනාශ මුඛයට ඇද දැමීමටත් හේතු විය හැකි ය. භෞතික විද්‍යාඥ ස්ටීවන් හෝකින් වරක් ප්‍රකාශ කර සිටියේ කෘත්‍රිම බුද්ධිය දිනක අනුකම්පා විරහිත ව මිනිසාට එරෙහිව නැඟී සිටින බව යි. තරුණ පරපුර යනු අනාගතයේත්, වර්තමානයේත් ලෝකයේ දිශානතිය තීරණය කරන්නෝ ය. ඒ අනුව තාක්ෂණයේ පෙරටුගාමීත්වය සමඟ ලෝකය දිනන්නට සැරසෙන තරුණ පරපුර එහි අයහපත් පැතිකඩයන් මඟහැර නිවැරදි මංපෙත් ඔස්සේ ඉදිරියට යාමේ වගකීම ඉසිලිය යුතු ය.

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය මඟින් ඉදිරිපත් කරන සංඛ්‍යාන සරණිය සඟරාවෙහි දෙවන වෙළුමෙහි දෙවන කලාපය ''තාක්ෂණය මුසු තාරුණ්‍යය - සංඛ්‍යානමය ඇසින්'' යන තේමාව මුල් කරගනිමින් බුද්ධිමය හා සෞන්දර්යාත්මක විමසුමකින් පාඨක හද තුළ තාරුණ්‍යයේ තාක්ෂණික විප්ලවය අරුත් ගන්වන්නට මෙහි ලා දරණ එක් ප්‍රයත්නයකි.

**මූලාශ්‍ර:**

"Computer Literacy Statistics-2020(Annual)." Department of Census and Statistics, December 2020. ISSN 2012-6565

Rehman, A., Jingdong, L., Khatoon, R., & Hussain, I. (2016). Modern Agricultural Technology Adoption its Importance, Role and Usage for the Improvement of Agriculture. Environ. Sci., 6.

Renu, N. (2021). Technological advancement in the era of COVID-19. SAGE Open Medicine, 9, 20503121211000910. https://doi.org/10.1177/20503121211000912

Youth and technology: 5 ways we're changing the world | United Nations Development Programme. (n.d.). Retrieved October 14, 2021, from https://www.undp.org/blog/youth-and-technology-5-ways-were-changing-world



ගයේෂි ලියනගේ
සිව්වන වසර



"This will finally bring us up to the 20th century and also create opportunities for our youth to gain life-skills in the area of technology"

- Ken Wong -



## *Prisoned Mind*

Here and there in the world
Evolves new trends
Machines, software, vehicles
Many more...
They say it makes things easy
They say it saves our time
They say it's a big revolution
but,
Do we have time to look at the sky?
To see the stars and imagine an unseen world?
To feel the blowing wind and dream to be a bird?
Not for me.
Do you?

**G.S.N. Weerasinghe**
**Third year**





## තාක්ෂණික කල්පිතය...

දියුණු ලොවක් තැනුමට
අනුලෝමව තාක්ෂණය මුසු කරමින්
විසඳුම් නොමැති සමීකරණවල
ගෙවන ජීවිතවල
සෝෂල් මීඩියාවලින්
පිළිතුරු සොයන අපූරුව
දුරකථන ලැප්ටොප්, ඩෙක්ස්ටොප්
නොදන්නා පදවලට හිරවෙලා
තුරුණු විය නොදැනීම
අභිශුන්‍ය කුලකය වෙලා
තාක්ෂණික විප්ලව
දියුණුවට කල්පිත ගොඩනගා
තාක්ෂණය තුළ
ඉගෙනුම ද ආර්ථිකය ද ජය ගත හැකි
$H_0$ කල්පිතය
තාක්ෂණය මුසු තාරුණ්‍යයේ
කල්පිත පරීක්ෂාවේ
පිළිගැනුම් කල්පිතය වෙලා

**සඳරේණු ලියනගේ**
**තෙවන වසර**

## පරිපථයෙන් පිබිදෙන සාතීය රේඛාව

දිනෙන් දින අලුත්වන
තුරුණු ලෝකයෙ සවිය
Software මත දිවෙන
විසිරි තිත් සටහනකි

Software ලෝකයේ
සබඳතා සංගුණක
නියැදියක් ගෙන අහඹු
බලන්නට හැකි වේද

ගොඩනැගෙන හෙට ලොවෙහි
සංඛ්‍යා වගු දත්ත
Analyze කරන්නට
රූල් කොළ මදි වේවි

හණ මිටිය කර තියන්
ඇවිදිනා මළ කඳන්
Technology මුරපදය
යටිකුරුව දකින්නෙ ද

තාක්ෂණ විප්ලවයෙ ඇත ලකුණු පහළ වී
ANOVA වගු දත්ත හඬ නගයි සිනා සී
යොවුනැසින් ගොඩනැගෙන නව ලොවක මුලාවී
ප්‍රස්තාර ඇද වේවි ආදේශ වැරදි වී

සඳුන් බුද්ධික ද සිල්වා
දෙවන වසර

# SRI LANKAN

## Youth & Their Exposure to the Technology




Sri Lankan youth and their dealing with technology have become a hot topic these days. As an initiative to the topic, it is important to understand what youth means. According to the definition of the United Nations, "Youth is best understood as a period of transition from the dependence of childhood to adulthood's independence". Alongside this definition of 'Youth', it can be further defined as the people comprising of the age group 15 to 24 years. However, in countries like Sri Lanka, the situation is different. In accordance with the National Youth Policy of Sri Lanka, youth is defined as those within the age group of 15 – 29. According to the United Nations Development Program (UNDP) in 2016, 23.2% of Sri Lanka's total population is youth. Considering the exposure of the Sri Lankan youth to technology, its gradual growth spans over 15 to 17 years. The internet, desktop computers, laptops, palmtops and smartphones have been a major factor in helping young people to connect with technology and have led to social transformation. These modes facilitate the rapid diffusion of information and the creation and maintenance of the social network. According to the data published by the Census and Statistics Department of Sri Lanka, the annual digital literacy rate of our country from 2017 to 2020 provides a comprehensive understanding of the gradual development of technology and the exposure of youth towards technology.

Table 1.1: Depicts the digital literacy rate of Sri Lanka from 2017 to 2020.

| By age group | Digital Literacy (2017) | Digital Literacy (2018) | Digital Literacy (2019) | Digital Literacy (2020) |
|---|---|---|---|---|
| 15 - 19 | 60.7 | 73.9 | 77.8 | 82.2 |
| 20 - 24 | 55.1 | 77.6 | 78.6 | 83.7 |
| 25 - 29 | 45.8 | 68.9 | 73.4 | 76.0 |

Source : Digital literacy rate by Age group (in percentage) www.statistics.gov.lk

Studying the above table, the period between 2017 and 2018 is very important when considering the digital literacy rate in Sri Lanka. This is because the use of technology by youth between the ages of 15 and 19 has increased by 13.2% in 2018 compared to 2017. Moreover, the number of young people between the ages of 20 and 24 who are involved in technology have increased by 22.5% in 2018 compared to 2017, while the number of young people between the ages of 25 and 29 who have dealt with technology has increased by 23.1% in 2018. It should be noted that the digital literacy rate between 2019 and 2020 does not indicate a significant increase compared to 2018. However, the percentage change from 2019 to 2020 has increased by 4% in the age group of 15-19 while, 5.1% in the 20–24 age group and 22.6% in the age group of







25-29. Collectively the behaviour of digital literacy throughout the period (2017 – 2020) shows a positive trend. Hence, it can be expected that the rate would show a positive increment in the upcoming years.

However, there are many causes for youth to get involved in technology. For examples, to pursue Educational Goals, Communication, Online Banking, Online Gaming, Online Shopping and other entertainment purposes. The recent outbreak of the Covid-19 pandemic has been a major factor for young people to grasp the technology. Apart from these, it should be emphasized that the interaction between youth and technology has both positive and negative consequences. However, it is undoubtedly a fact that in the present context the interrelationship between youth and technology cannot be broken and it can be pointed out that the use of technology in a disciplined manner leads to the betterment of the society and the well-being of individuals.

**References:**


Department of Census and Statistics (2017). Computer Literacy and Digital Literacy. Computer Literacy Statistics – 2017(Annual), 3, ISSN 2012-655 http://www.statistics.gov.lk

Department of Census and Statistics (2018). Computer Literacy and Digital Literacy. Computer Literacy Statistics – 2018 (Annual), 3, ISSN 2012-6565, http://www.statistics.gov.lk

Department of Census and Statistics (2019). Computer Literacy and Digital Literacy. Computer Literacy Statistics – 2019 (Annual), 3, ISSN 2012-6565, http://www.statistics.gov.lk

Department of Census and Statistics (2020). Computer Literacy and Digital Literacy. Computer Literacy Statistics – 2020 (Annual), 3, ISSN 2012-6565, http://www.statistics.gov.lk

United Nations Department of Economic and Social Affairs (2015). Definition of Youth. http://undesadspd.org/Youth.aspx




**Ithara Mihinadani Liyanage**
**Second Year**

සංඛ්‍යාන සරණිය මාර්තු - 2022

# තාක්ෂණික සමීකරණය

හසුන්පත් ලිවීමට
නොහැකිය දැන් ඔවුනට
SMS ආදරය
සමගාමී සමීකරණය,
උදේට, දවල්ට, රෑට
කෑමට **FB**
අතුරුපසට WhatsApp
තරුණ ජීවිත
ගෙවෙන අපූරුව
මනින්ට හදන්නට වෙයි
අලුතින් ම cal එකක්,
වගු දත්ත ප්‍රස්තාර
ලියන්නට හැකි වෙයි නමුත්,
සරල රේඛා වක්‍ර වෙයි
තරුණ ජීවිත දැක්කහොත්,
Online ජීවිතලු
තරුණ හිත් ගොළුවෙන
නියැදියක් ගන්නටත් පුළුවන් ද,
ඔක්කොම මොළ හිස් ද?

ධන සෘණ නිබිල
සොයන්නට නැත වෙලාවක්
මොළත් මොට්ටයි
අහෝ !
මේක නම් දැන්
නින්දක් නැති
Social media උගුලක්

ආපිටට ඇසුණා
මේකටම වදනක්
අපූරු ම කුලකයක
ඇයි ද එක පැත්තක්
දුටුවේ නෑ කවුරුත්
ඇති බවට විසඳුම්
X , Y ත් දශමෙන්
මොළ හැදුවා කඩියෙන්
මොට කොහෙද බැලුවෙන්
තේරේවි සරියෙන්
Technology බඩුවෙන්
නෑ මැරුණෙ වැඩ්ඩෙක්

උන් හැදුනේ ඔළුවෙන්
නෑ වැටුණේ කබලෙන්
ප්‍රස්තාර ඇන්දෙත්
තත්පරෙන් ක්ෂණයෙන්
බලයි පරපුරේ කෙරුමන්
සමීකරණත් පුදුමෙන්
ගල් යුගෙන් විත් දැන්වත්
විඳින හැටි ඇති සැටියෙන්

සෙව්වන්දි හේරත්
දෙවන වසර




*"Technology is a useful servant but a dangerous master"*
*- Christian Lous Lange -*



# THE LANCET

## ළමා සහ යොවුන්වියට පිවිසෙන දරුවන්ගේ සෞඛ්‍යය සමීක්ෂණය (The Lancet Child and adolescent Health) මඟින් හෙළි වූ තාක්ෂණයේ අඳුරු පැතිකඩ

ලාන්සෙට් - ළමා සහ යොවුන්වියට පිවිසෙන දරුවන්ගේ සෞඛ්‍යය සමීක්ෂණය (The Lancet Child and adolescent Health) යනු 2013-2015 අතර එංගලන්තයේ වසර තුනක් පුරා අවු. 13-16 අතර නව යොවුන්වියේ පාසල් සිසුන් 10,000 කට ආසන්න පිරිසක් අධ්‍යයනය කිරීම මඟින් සිදු කරන ලද සමීක්ෂණයකි.

වත්මන් සමාජය තුළ මානසික සෞඛ්‍යය සහ මානසික රෝග යනු, නිරන්තරයෙන් අවධානයට ලක්වන මාතෘකාවලින් එකකි. අප නොදන්නවා වුව ද මෙම මානසික රෝගවලින් හරි අඩකටත් වැඩි ප්‍රමාණයක් අවුරුදු 14 ක් වැනි සුළු වයසක දී සිට ආරම්භ වී කාලයත් සමඟ වර්ධනය වීමේ හැකියාවක් පවතියි. එබැවින් නව යොවුන්විය යනු, පුද්ගලයෙකුගේ මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කෙරෙහි දැඩි ලෙස බලපාන තීරණාත්මක අවධියකි. පසුගිය දශක කිහිපය හා සසඳා බලන විට වත්මන් තරුණ පරපුර අතර කාන්සිය (Anxiety), විෂාදය (Depression), පෞරුෂත්ව ආබාධ (Personality disorders) වැනි මානසික රෝගී තත්ත්වයන් බහුල ව දැක ගත හැකි ය.

ශ්‍රී ලංකාව තුළ පමණක් නො ව සමස්ත ලෝකය තුළ ම දකින්නට ලැබෙන මෙම පොදු තත්ත්වයට දෙමව්පියන්, ගුරුවරුන් ඇතුළු වැඩිහිටි පරපුරේ බොහෝ දෙනෙකු ප්‍රධාන හේතුවක් වශයෙන් ඉදිරිපත් කරන්නේ තරුණයන් තුළ පවතින අධික තාක්ෂණික ඇබ්බැහිවීම යි. මේ අතරිනුත් ප්‍රධාන වශයෙන්ම හේතුවක් ලෙස ඔවුන් ඉදිරිපත් කරන්නේ අධික සමාජ මාධ්‍ය ජාල භාවිතය යි.

මෙම සමීක්ෂණය පැවැත්වූ එක්සත් රාජධානිය තුළ ද යොවුන්වියේ පසුවන්නන් සෑම දහ දෙනෙකුගෙන් නව දෙනෙක් ම (90%) සමාජ මාධ්‍ය ජාලවලට පිවිසෙන අතර මෙම තත්ත්වය පිළිබඳ ඇති වූ බොහෝ මතවාද, මැසිවිලිවලට පිළිතුරක් සෙවීම සඳහා මෙම සමීක්ෂණය පවත්වන ලදී. මෙම Lancet Child and adolescent Health සමීක්ෂණයේ දී තෝරාගත් පාසල්වල ඉගෙනුම ලබන ළමුන්ට වර්ෂ 3 ක් තිස්සේ පහත සඳහන් එක ම ප්‍රශ්නය යොමු කෙරිණි.

"Instagram, Fecebook, WhatsApp, Snapchat & Twitter වැනි සමාජ මාධ්‍යවලට ඔබ දවසකට කොපමණ වාරයක් පිවිසෙන්නේ ද?" මෙහිදී සමීක්ෂකයන් මෙම සිසුන් කොපමණ කාලයක් සමාජ මාධ්‍ය තුළ රැඳී සිටින්නේ ද යන ප්‍රශ්නය වෙනුවට ඔවුන් දිනකට කී වරක් මෙම සමාජ මාධ්‍යවලට පිවිසෙන්නේ ද යන්න පිළිබඳ පමණක් අවධානය යොමු කළහ.

2013 වසරේදී සිසුන් 13,000ක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් පසුව ඉහත සඳහන් පැනයට පිළිතුරු වශයෙන් ගැහැනු ළමයින්ගෙන් 51% ක් සහ පිරිමි ළමයින්ගෙන් 43% ක් තමන් එක් දිනකට කිහිප වතාවක් (3 වරක් හෝ ඊට වැඩි) සමාජ මාධ්‍යවලට පිවිසෙන බව කියා සිටියහ.

2014 වන විට, දිනක් තුළ කිහිප වතාවක් සමාජ මාධ්‍ය ජාලවලට පිවිසෙන ගැහැණු ළමුන්ගේ අනුපාතය 68% ක් දක්වා ඉහළ ගිය අතර, පිරිමි ළමුන්ගේ එම අනුපාතය 51% ක මට්ටමේ විය. යළිත් 2015 වන විට, මෙම අනුපාතයන්, ගැහැණු ළමුන්ගේ අනුපාතය 75% ක් සහ පිරිමි ළමුන්ගේ අනුපාතය 69% ක් ලෙස වාර්තා විය.

මීට අමතර ව, සමීක්ෂණයේ දෙවෙනි වසරේ දී (2014), අධ්‍යයනයට ලක් කරන නියැදියට අයත් සිසුන්ගේ මානසික සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්නාවලියක් ඔවුන්ට යොමු කරන ලද අතර සයිබර් අවකාශයේ මුහුණදුන් අතවර (Cyberbullying), ඔවුන්ගේ එදිනෙදා ශාරීරික ක්‍රියාකාරකම් සහ නින්දේ ගුණාත්මකභාවය පිළිබඳව විමසීමක් එමගින් සිදුකර ඇත. ඉන්පසු නැවත වරක් 2015 දී ළමුන්ගේ සතුටේ මට්ටම, චිත්ත පීඩාවට පත්වෙන ආකාර, කාන්සාව (Anxiety) සහ ජීවිතය සම්බන්ධයෙන් ඔවුන්ට තිබෙන තෘප්තිය පිළිබඳවත් විමසනු ලැබිණි.

2014 දී යොමු කරන ලද ප්‍රශ්නාවලියෙන් ලැබුණු දත්ත මත සමාජ මාධ්‍ය ජාල දිනපතා කිහිප වරක් භාවිතා කරන ගැහැනු සහ පිරිමි යන දෙපාර්ශවයේ ම සිසුන් දැඩි මානසික පීඩනයකින් පෙළෙන බව හෙළි විය. මේ අතරිත් මෙම තත්ත්වය වඩා පැහැදිලි ව නිරූපණය වූයේ ගැහැනු ළමුන් තුළිනි. දිනපතා වැඩි වාර ගණනක් සමාජ මාධ්‍ය භාවිත කරන ගැහැනු ළමයින් දැඩි ලෙස මානසික පීඩනයෙන් පෙළෙන බවත්, සතිපතා ඉතා ම අඩුවෙන් සමාජ මාධ්‍ය භාවිත කරන ගැහැනු ළමුන් අතර මෙවන් ප්‍රශ්නයක් නැති බවත් අනාවරණය විය. එබැවින් අපට දිනපතා සමාජ මාධ්‍යවලට පිවිසෙන වාර ගණන සහ සිසුවියන්ගේ මානසික පීඩනය අතර ප්‍රබල ධන සහසම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකි ය.

එසේම 2015 දී කළ විමසීම් මඟින් හෙළි වුයේ වූයේ සමාජ මාධ්‍ය ජාල දිනපතා කිහිප වරක් භාවිතා කරන ගැහැනු ළමුන් දැඩි ලෙස කාන්සාවෙන් (Anxiety) පෙළෙන බවත්, ජීවිතය පිළිබඳ ඉතා අඩු තෘප්තියක් තිබෙන බවත් ය. කෙසේ නමුත් පරීක්ෂණයට ලක් කල පිරිමි ළමුන් අතර මේ තත්ත්වය ගැහැනු ළමුන්ගේ මෙන් පැහැදිලි ව දැක ගත නොහැකි විය. එබැවින් සමාජ මාධ්‍යය තුළ සැරි සැරීම පිරිමි ළමුන්ට සහ ගැහැනු ළමුන්ට ඇති කරන බලපෑමේ වෙනසක් පෙනී යන නමුත්, එසේ වීමට හේතුව තවමත් තේරුම්ගෙන නැති බවත් ඒ පිළිබඳ තවත් පරීක්ෂණ සිදු කළ යුතු බවත් පර්යේෂණ කණ්ඩායම මෙම පරීක්ෂණය අවසානයේ සඳහන් කර ඇත.

මෙම සමීක්ෂණය මෙහෙයවන ලද ලන්ඩන් සරසවියේ (UCL) යොවුන් සෞඛ්‍යය පිළිබඳ මහාචාර්ය රසල් විනර් (Russell Viner) මහතා පවසන්නේ නව යෞවනයන් මුහුණ දෙන මෙම මානසික සෞඛ්‍යය ගැටලුවලට අධික සමාජ මාධ්‍යය භාවිතය ඇති කරන බලපෑම වක්‍ර බව යි. එනම් සමාජ මාධ්‍ය අධික ව භාවිතා කිරීම තළින් ඔවුන්ගේ සෞඛ්‍යයට ධනාත්මක බලපෑමක් ඇති කරන ප්‍රමාණවත් නින්දක් ලැබීම, ප්‍රමාණවත් ව්‍යායාම ලබා ගැනීම වැනි යහපත් සෞඛ්‍යය පුරුදු ඔවුන්ට මගහැරීම තුළින් සහ සමාජ මාධ්‍ය ජාලා තුළ සයිබර් හිරිහැරයන්ට නිරාවරණය වීම වැනි කටුක සිදුවීම්වලට මුහුණදීමට සිදු වීම තුළින් මෙම මානසික පීඩනයන් හා මානසික ගැටලු ඇති වන බව යි.

එබැවින් මහාචාර්ය රසල් විනර් මහතා ඇතුළු පරීක්ෂණ කණ්ඩායම යෝජනා කරන්නේ, දෙමව්පියන් සහ අනෙකුත් වැඩිහිටියන් විසින් මෙම නව යෞවනයන් කොතරම් වෙලාවක් සමාජ මාධ්‍ය භාවිත කරනවා ද යන්න ගැන ප්‍රශ්න කරනු වෙනුවට කළ යුත්තේ යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කිරීමටත්, ප්‍රමාණවත් නින්දක් ලබා ගැනීමටත්, දිනපතා ව්‍යායාමවල යෙදීමටත් දරුවන් උනන්දු කිරීම යි. එසේ ම ඔවුන් තවදුරටත් පවසන්නේ, සමාජය විසින් තරුණයන් සමාජ මාධ්‍යය ජාලා භාවිත කිරීම පිළිබඳව නිතර ම සෘණ ආකල්පයක් දැරිය නො යුතු බව යි. මන්දයත් මෙම සමාජ ජාලා තුළින් තාරුණ්‍යයට ලබා ගැනීමට බොහෝ යහපත් දේවල් ද පවතින බැවිනි.

ශ්‍රී ලංකාව තුළ ද වර්තමානය වන විට මිලියන 7.9 කටත් වැඩි පිරිසක් සමාජ මාධ්‍යයන් භාවිත කරන අතර ඩිජිටල් අවකාශය තුළ සිදුවන සයිබර් ප්‍රහාර වැනි විවිධ හේතු මත සිදු වන මිනීමැරුම්, සියදිවි නසාගැනීම් වැනි සිදු වීම් ද අද වන විට ලංකාව තුළ සුලභ ය. එබැවින් ශ්‍රී ලංකාව තුළ ද සමාජ මාධ්‍යයන් පොදු යහපත සඳහා ඵලදායී ව යොදා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් මෙහි පවතින අඳුරු පැතිකඩෙන් තාරුණ්‍යය ගලවාගන්නේ කෙසේ ද යන්න පිලිබදවත් පුළුල් කතිකාවක් නිර්මාණය කර අවශ්‍ය පියවර ගැනීමට සුදුසු ම කාලය මෙය යි.

මූලාශ්‍ර:

Eccleston, C., Fisher, E., Howard, R. F., Slater, R., Forgeron, P., Palermo, T. M., Birnie, K. A., Anderson, B. J., Chambers, C. T., Crombez, G., Ljungman, G., Jordan, I., Jordan, Z., Roberts, C., Schechter, N., Sieberg, C. B., Tibboel, D., Walker, S. M., Wilkinson, D., & Wood, C. (2021). Delivering transformative action in paediatric pain: A Lancet Child & Adolescent Health Commission. The Lancet Child & Adolescent Health, 5(1), 47–87. https://doi.org/10.1016/S2352-4642(20)30277-7



දිල්රු දොඩවත්ත
දෙවන වසර



සංඛ්‍යාන සරණිය මාර්තු - 2022

# තාක්ෂණයේ උපනතිය

ගින්දරෙන් රෝදයට පියවරෙන් පියවරට
තාක්ෂණයේ ගමන්මග දිග හැරුණු පෙර දවස
මානව පරායත්තයේ ස්වායත්ත විචල්‍යය
ඒ තාක්ෂණය වේ යැයි කිසිවෙක් නොසිතන්නට ඇත...

පාසල නිවසට ම ළඟු වී අධ්‍යාපනය Smart වන විට,
යොවුන්විය ඩිජිටල් වී පොත්පත් අභිශූන්‍ය වන බව
කිසිවෙක් නොසිතන්නට ඇත...

ප්‍රියයන් අතර පරතරය කලා විකලා පමණ වන විට,
සොඳුරුතම තාරුණ්‍යය චතුරස්‍රක විචලනය වන විට,
ප්‍රේමය හා පෙම්වතුන්ගේ සමාකලිත විචල්‍යය
තාක්ෂණය වේ යැයි
ඔවුන්ට ද නොසිතෙන්නට ඇත...

සියලු රහැන් විභේදනය වී
මිනිසා ඒක විචලව විශ්ලේෂණය වන දිනට,
ඍණ උපනතියකින් ශූන්‍යට ළඟා වූ මිනිසත්කම
අප වැළඳගනු ඇත...

ඉමල්ෂා නිම්තරා මෙනවිය
සහාය කථිකාචාර්ය

# තාක්ෂණයේ පුරෝකථනය...

දින සති ගෙවෙන
කාලශ්‍රේණියේ,
ක්ෂය වන හෝරාවක් පාසා
කෙළිලොල් වූ
තාරුණ්‍යය
වියැකී යයි...
දිගු කාලීන උපනතියකින්
මව් සංගහනයේ
එක අන්තයක
PUBG, Far Cry, Crysis, Call of Duty
ක්‍රීඩා කරන තරුණයන්ය,
තරු ඉල්ලන තරුණියන්ය,
තවත් අන්තයක
AI, E-commerce, Nano Tech
සමග ඉහළට යන
තරුණ තියැදින්ය...
මෙයයි තාක්ෂණයේ අරුමය
එහෙයින්,
අදිටන් කරගමු
පුරෝකථනය කරන්නට
තාක්ෂණික වාසියෙන් පිරි
බුද්ධිමත් තාරුණ්‍යයක්...

ධනුක දිල්ශාන්
තෙවන වසර





"People who smile while they are alone used to be called insanse,until we invented smartphones and social media"

- Mokokoma Mokhonoana -






නිම්හියා විජේරත්න
තෙවන වසර



# RACE

Life is an endless race even though running track has an end. I see the form, the way of the position the every person around me hold on to be admired like I did in running. I see thousands of greedy attempts to gain merits wearing decorative costumes through their behaviour like cadence which is the number of steps a runner takes per minute in running.

I still hear rackety, harsh sounds of trains which I were heard in every minutes in my mind. Being a bastard, taught me life is a good mixture of harshness, blames, quarrels, frustration and sadness. My mother was a woman of word even though my father whom I have never seen was not. She sold everything that she had, for money without any pride in this commercialized world to live. It made her a strong lady who never saw my heart and my tears. My step-sisters always thought about their beauty and snatched most of things that I had from me to maintain their easy lives. I hadn't any sense of their lives. I had to dedicate my diet for their artificial lives all the time. Then, it kept my stomach empty in the most of time in the slum. To escape from hunger, what I did was running...running….and running.

I still remember the day that I met Sudhesh sir. He was a retired widower. I helped him to pick vegetables which were fallen on the road accidently. That was our first meeting. After that, he never let me be in hunger and gave me some expenditures of my school and to participate in athletics. He had known nothing about running and sports but the effort that he took in pushing me forward was inspirational…I still remember his words,

“I don’t believe that nourishing diet make a runner… Courage, running away from your own worries would make you a real runner"

That really touched my heart. That worked in every match that I won rather than any Coach's advices. Even yesterday in international match, what I did was I just closed my eyes and reminded what he said before I started the race. Like previous I won the match…

Now, there are thousands of people around me. For money my mother is with me here. One of my step sisters creates posts and makes status in her Facebook account like a machine. Now, she who has never talked with me about my sports has something to be busy with her most favourite thing. My other step sister has come here for her social status. She has well-polished her round shaped face and lips with floor paint. In the social media she is very interested in corporate social projects and trying to be an actress. She never saw my mother’s tears and the heavy effort in living. She never saw me as a sister. Now, I am her one and only sister in her Facebook account. For pride my step sisters are with me here.  But, he should be somewhere without even a hope of admiration…… I have no feeling towards these greedy people who are around me in this conference. What my heart says to me is run…run and run to him, hug and cry till you cure you own wound in your heart. Then, I will feel my father whom I have never seen. That will be the most silent moment in this whole universe.



**Ms. Tharanga Niroshika**
**Assistant Lecturer**




තාක්ෂණය අද්‍යතනයේ දී විශාල පිම්මක් පනිමින් අදහාගත නොහැකි වේගයකින් ගෝලීය වශයෙන් නව ඉසව්වක් කරා වර්ධනය වෙමින් පවතී. මේ වන විට ලොව පුරා පැතිර ඇති තාක්ෂණික වර්ධනය ප්‍රධාන ධාරා ත්‍රිත්වයක් ඔස්සේ හඳුනාගත හැකි ය.

01) නැනෝ තාක්ෂණය
02) අභ්‍යවකාශ තාක්ෂණය
03) පරිගණක තාක්ෂණය

මේ අතරින් පරිගණක තාක්ෂණයේ දියුණුව හරහා සමාජයට එකතු වූ නවාංගයක් ඔස්සේ තාරුණ්‍යයට සිදු වූ බලපෑම පිළිබඳ ව මෙම ලිපිය ඔස්සේ අවධානය යොමු වේ. මෙම පරිගණක තාක්ෂණයේ දියුණුව කොතරම් ද පෙන්වා දීමට උචිතම සාධකය වන්නේ, මෙහි කූඨප්‍රාප්තියක් ලෙස කෘත්‍රිම බුද්ධියක් නිර්මාණය වෙමින් පැවතීම යි. මෙම පරිගණක තාක්ෂණය මෙතරම් වේගයකින් ගමන් කිරීමට අදාළ සුවිශේෂී දැනුම් පද්ධතියක් 2015 හා 2016 වසරේ දී බිහි වී ඇත. එම නව දැනුම් පද්ධති හරහා තාක්ෂණය මෙලෙස පිම් පනිමින් ඉදිරියට පැමිණීම සිදු වේ. ඒ ඔස්සේ විශ්වය ම තාක්ෂණික යුගයක් කරා පැමිණ ඇත. මෙවැනි තාක්ෂණික යුගයක ජීවත් වන අප මෙම මාවතේ තරුණ ප්‍රජාව සිටින්නේ කොතැනක ද යන්න අවබෝධ කර ගැනීම වඩා වැදගත් ය. මක්නිසාද යත් එය විශ්වයේ හෙට දවස පිළිබඳ ලබා ගන්නා අවබෝධයක් වන බැවිනි. තරුණ ප්‍රජාව උක්ත කරගත් විට නව සමාජ මාධ්‍ය ඒ හා සමපාත වන බව නොරහසකි. පරිගණක තාක්ෂණයේ දියුණුව හරහා සමාජයට එකතු වූ නවාංගය වන්නේ ද මෙම සමාජ මාධ්‍යය වේදිකාව වේ.

පරිගණක තාක්ෂණයේ දියුණුව සමඟ නව සමාජ මාධ්‍ය බිහි වීම යනු සමාජ ක්‍රියාවලියේ සුවිශේෂී සංධිස්ථානයකි. නිර්වාචික යුගයෙන් ඇරඹි සන්නිවේදනය භාෂණ හා ලේඛන යුග පසු කරමින් වර්තමානය වන විට නව තාක්ෂණය කරා පැමිණ ඇත. එහි දී සන්නිවේදනය තිඹිරිගෙයි සිට සයිබර් අවකාශය කරා පැමිණි ගමන්මග ඉතා වේගවත් ය. 21 වන සියවසේ ආරම්භය සමඟ මුළු ලොව ම විශ්ව ගම්මානයක් (Global Village) බවට පත් ව ඇත්තේ, තාක්ෂණික දියුණුවෙහි ප්‍රතිඵලයක් වන අන්තර්ජාල මාධ්‍ය නිසාවෙන් මෙය මානව සංහතියේ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස හඳුන්වාදීම වඩාත් සුදුසු ය.



නූතන ගෝලීය සමාජයේ සංස්ථාවන් සහ ඒවායේ වේගවත් ව්‍යාප්තිය සඳහා තාක්ෂණය මඟින් කරනු ලැබ ඇති බලපෑමේ ප්‍රමාණය පසුගිය දශක කිහිපය තුළ ලොව බොහෝ රටවල දියුණුව දෙස බැලීමෙන් අවබෝධ කරගත හැකි ය. මේ අතරින් අන්තර්ජාල තාක්ෂණය ආශ්‍රිත ව ගොඩනැගුණු නව සමාජ මාධ්‍ය තුළ බිහි වූ Facebook, WhatsApp, Twitter, Messenger, Viber, Imo, Snapchat, Telegram, Instagram වැනි සමාජ මාධ්‍යය මඟින් සමස්ත සමාජ විඥානයට ම බලපෑමක් සිදු කරමින් පැවති සාම්ප්‍රදායික සංහතික මාධ්‍යයන්වලට විශාල අභියෝගයක් වෙමින් ශීඝ්‍රගාමී ව ඉදිරියට ගමන් කරයි. ඒ අනුව එහි වැඩි බලපෑමට ලක් ව ඇත්තේ අන්තර්ජාල භාවිතය හා නිතර බැඳී සිටින තරුණ පරපුර යි. තාරුණ පරපුර යනු දිනෙන් දින අලුත් වන සිතිවිලි, ආකල්ප සමඟ ගොඩනැගෙන කණ්ඩායමකි. ඔවුන් ඉතා වේගවත් ව නව තාක්ෂණය හා මුසු වේ. මේ සියවස වන විට තරුණ පරපුර තම අධ්‍යාපන, සංස්කෘතික, සමාජ භාවිතයන් සඳහා ආදේශන සපයා ගන්නේ අන්තර්ජාල තාක්ෂණය ප්‍රමුඛ කරගත් සමාජ මාධ්‍යය භාවිතයන්ගෙන් බව නොරහසකි. නමුත් "පිහිය රත්තරන් වුව ද බෙල්ල කපාගන්නේ නැත" යන්න ද මතක තබා ගත යුතු ය.





පසුගිය දශක දෙක තුළ නව මාධ්‍ය ලොව පුරා ශීඝ්‍ර ව්‍යාප්තියක් හා කීර්තියක් අත්පත් කරගෙන ඇති බව බොහෝ පර්යේෂකයින් විසින් අනාවරණය කර ගෙන ඇති අතර ඒ හරහා ප්‍රජාවට ඇති කරන බලපෑම පිළිබඳ ව ද වැඩිදුර අධ්‍යයනයන් සිදු කර ඇත. විශේෂයෙන් ම තරුණ ප්‍රජාව ගත් කළ ඔවුන් මෙම මාධ්‍ය අතරින් අවම වශයෙන් එක් සමාජ මාධ්‍යයක් සමඟ හෝ සම්බන්ධ ව සිටින බව අනාවරණය කර ගෙන ඇත.

අද්‍යතන යොවුන් සංස්කෘතිය තුළ සමාජ මාධ්‍ය විශාල කාර්යභාරයක් ඉටු කරන අතර සමීක්ෂණවලින් පෙනී යන්නේ වයස අවුරුදු 13-17 අතර යෞවනයන්ගෙන් 90% ක් සමාජ මාධ්‍යය භාවිතා කර ඇති බව යි. අවම වශයෙන් එක් ක්‍රියාකාරී සමාජ මාධ්‍ය පැතිකඩක් සමඟ හෝ සම්බන්ධ වී ඇති ප්‍රමාණය 75 ක් වාර්තා කරන අතර, අවම වශයෙන් දිනපතා සමාජ මාධ්‍යය වෙබ් අඩවියකට පිවිසීමේ ප්‍රතිශතය 51% ක් බව වාර්තා කරයි. යෞවනයන්ගෙන් 2/3 කට අන්තර්ජාල පහසුකම් සහිත තමන්ගේ ම ජංගම උපාංග පවතින බව ද සමීක්ෂණවලින් අනාවරණය වී ඇත.

2019 වර්ෂය වන විට යෞවනයන් අතර Snapchat හි ආකර්ෂණීය වර්ධනයක් ඇති බව පැහැදිලි වේ. නමුත් ගෝලීය වශයෙන් වයස අවුරුදු 13-17 අතර යෞවනයන් අතර ජනප්‍රිය ම සමාජ මාධ්‍යය බවට වාර්තා වී ඇත්තේ Facebook සමාජ මාධ්‍ය වේ. මෙයට සියලු ම නව යොවුන් වියේ පසුවන්නන් ඇතුළත් වන පරිදි වයස් පරතරය දීර්ඝ කරන්නේ නම් Facebook හි සිටින පරිශීලකයන් සංඛ්‍යාව Snapchat සහ Instagram ඒකාබද්ධ කළ විට ලැබෙන පරිශීලකයන් සංඛ්‍යාවට ආසන්න වේ. 2019 අප්‍රේල් මාසයේ සිට භාවිත කරන වයස අවුරුදු 13-17 අතර පරිශීලකයන් සංඛ්‍යාව මිලියන 05 කින් පමණ වැඩි වී ඇත.

සමකාලීන සන්නිවේදන අවකාශය තුළ තරුණ ප්‍රජාව මුහුණ දී ඇති නවතම තත්ත්වය වන්නේ සමාජ මාධ්‍ය භාවිතය තුළ විවිධ විශ්වාස, පුරුදු වැනි දේට ඇබ්බැහි වීම යි. මෙම නව මාධ්‍ය භාවිතයේ වාසි අවාසි සමාන මට්ටමේ පැවතිය ද වර්තමාන තරුණ ප්‍රජාව එහි අවාසි සහගත පෙදෙසට වැඩි නැඹුරුවක් දක්වන බව පෙනී යයි. එහි ඛේදනීය තත්ත්වය වන්නේ තරුණ ප්‍රජාව නොදැනුවත්ව ම මානසික මෙන් ම සමාජීය, සෞඛ්‍යය වශයෙන් අර්බුදයන්ට ලක්වීම යි. එහි ප්‍රතිඵලයක් ලෙස නවතම අනාවරණවලින් පෙන්වා දී ඇත්තේ මෙම නව මාධ්‍ය නිසා ලෝකයේ සෑම මිනිත්තු 40 කට වරක් ම අපරාධයක් සිදු වන බව යි. එසේ ම සමාජ මාධ්‍ය වෙබ් අඩවි හරහා තරුණ ප්‍රජාව යාවත්කාලීන වෙමින් ගමන් කරන පිරිසක් බව පෙන්වීමට උත්සාහ කළ ද සැබැවින් ම සමාජය තුළ ඔවුන් හුදකලා වීමට සමාජ මාධ්‍යය බලපානු ලබයි. එනම් තරුණ තරුණියන් අතර මුහුණට මුහුණ ලා කටයුතු කිරීම අවම වීම මීට හේතුව වේ. එම තත්ත්වය මානසික මෙන් ම කායික ගැටලු ගණනාවක් ඇති කළ හැකි තත්ත්වයක් බව විවිධ විද්‍යාඥයින් විසින් අනාවරණවලින් හෙළි කරගෙන ඇත. ඒ අතර මානසික අවපීඩනය, කාංසාව වැනි තත්ත්වයන් ප්‍රධාන වේ.

තව ද මෙම සමාජ මාධ්‍යය හරහා දුරාචාර සාහිත්‍යයට හා අසභ්‍ය වීඩියෝ පටවලට ප්‍රවේශ වීම පහසු වීම නිසා තාරුණ්‍යයේ සදාචාරාත්මක පැතිකඩ අඩපණ වේ. එමෙන් ම මෙම සමාජ මාධ්‍යවල කාලය කා දැමීම හරහා තාරුණ්‍යයේ වටිනා කාලය අපතේ යාමක් සිදු වේ. නමුත් එය ඔවුන්ට නොදැනේ. ඒ හරහා තාරුණ්‍යය ස්වයංපෝෂිත වීම අඩුවන අතර තවදුරටත් ඔවුන් දෙමව්පියන් මත යැපෙන කොටසක් බවට පත් වේ. අද්‍යතනය වන විට සමාජ මාධ්‍ය නිසා උද්ගත ව ඇති දරුණු ම තත්ත්වය වන්නේ මෙම සමාජ මාධ්‍ය වේදිකාව සයිබර් සොරකම් සඳහා මහඟු තෝතැන්නක් වී තිබීම යි. මෙහි දරුණු ම ප්‍රතිඵලය වන්නේ එකිනෙකාගේ පෞද්ගලික අනන්‍යතා සොරකම් කිරීමයි. එම නිසා තාරුණ්‍යය මාධ්‍යය භාවිතයේ දී ඉතා ප්‍රවේශම් විය යුතු අතර වඩාත් අවධානයෙන් කටයුතු කළ යුතු ය. නමුත් එවැනි අවධානයක් වර්තමාන තරුණ පරම්පරාව තුළින් දැකගත නොහැකි වීම කණගාටුවට කරුණකි.

පෙර සඳහන් කළ පරිදි සමාජ මාධ්‍ය හරහා තාරුණ්‍යයට බලපෑම් රැසක් ඇති වන බව පැහැදිලි ය. නමුත් සමාජ මාධ්‍යවල වාසි රැසක් ද පවතින බව අප අවිවාදයෙන් පිළිගත යුතු ය. වර්තමාන තරුණ පරපුර ඉන් අවාසි පැත්තට පමණක් නැඹුරු වීම ඛේදනීය තත්ත්වයකි. සමස්තයක් ලෙස අන්තර්ජාල සමාජ මාධ්‍යය තාරුණ්‍යයට ධනාත්මක මෙන් ම ඍණාත්මක බලපෑම් ඇති කරන බව අප පිළිගත යුතු ය. මෙම ඍණාත්මක බලපෑම් අවම කර ගැනීම අප සතු කාර්යභාරයකි. මක්නිසා ද යත් අපට මෙම තාක්ෂණික දියුණුව මඟහරවා ඉදිරි ගමනක් යාමට නොහැකි බැවිනි. නව තාක්ෂණය හා මුසු වීමේ දී එහි ඇති පෙර සඳහන් කරන ලද ඍණාත්මක බලපෑම් හඳුනාගෙන අවබෝධයෙන් හා දැනුමින් යුතුව කටයුතු කිරීම හරහා තාරුණ්‍යයේ ඉදිරි ගමන සාර්ථක කරගත හැකි ය.

විසි එක් වන සියවසේ බුද්ධිමතෙකු ලෙස සලකනු ලබන භෞතිකවිද්‍යාඥ හෝකින්ස් මේ පිළිබඳ ව වැදගත් අර්ථ දැක්වීමක් සිදු කර ඇත.

"හොඳට හෝ නරකට පරිසරය වෙනස් කිරීමට අප සතු තාක්ෂණික හැකියාවන් සමඟින් අපගේ ජනගහනය මිහිමත සීමිත සම්පත් පරිභෝජනයත් අධි වේගයකින් වැඩිවෙමින් පවතී. අපගේ ජාන රටාවන් දැනුම් පද්ධති තවමත් නොනැසී පවතින්නේ කළහකාරී බව සහ කෑදරකම ආශ්‍රය

කරමිනි. තාක්ෂණ වර්ධනයට සාපේක්ෂ ව දැනුම අත්පත් කර ගැනීමට අප උත්සාහ කරන්නේ නැත. ඒ නිසා ම එලඹෙන වසර දහසක් හෝ මිලියනයක් තිබුණත් වසර සියයක්වත් මිනිසාට මිහිතලය මත නිරුපද්‍රිත ව පැවතිය නොහැකි තත්ත්වයක් ඇති ව තිබේ."

**මූලාශ්‍ර:**


G. D. B. Jayamalee, SC/MM/2015/2016/29, තාරුණ්‍යය හා ජංගම දුරකථන (2018)

Lifie.lk , සමාජ මාධ්‍ය භාවිතය නව යෞවනයින්ට බලපාන හැටි (2020)

M. B. Ananda, SC/MAMM/2018/2019/25, සමාජ මාධ්‍ය හා තාරුණ්‍යයේ හෙට දවස (2019)

Thenextweb.com, Over 3.5 billion people are on social media (2019 July)

aacap.com, Social media and Teens, No.100 Updated March (2018)





නිපුනි ලියනගේ
දෙවන වසර










## Digital
## වෙන ගමන්...

පහළ ලියද්දේ සෙල්ලම් කරපු
ගමේ ගැන්සිය
දැන් PUBG ගහද්දී,
ලස්සන පත් රටා මැව්ව
සිලිඳි නගාලා
Online බඩු Order කරද්දී,
හවසට කෝපි කඩේට එන
කොල්ලෝ කුරුට්ටෝ
පරිගණක ඉස්සරහ ඉද්දී,
කළු ලැල්ලෙනුයි
හුණු කූරෙනුයි ඈත් වෙලා
Zoom මතකයේ රැඳෙද්දී,

හිතෙන්නේවත් නැද්ද
මනුස්සකම,
නිර්මාණශීලීත්වය,
ගුණධර්ම,
අපේ දේ...

සෘණ අනන්තයට යන ගමන් කියලා...


සහාය කථිකාචාර්ය
ඩබ්. ඒ. චතුරිකා එරන්දි




# Online තුළ සිරගත මිනිස්කම

දහදහස් සියදහස්
Like ගොඩ ගැහෙනවා
ඒ නියැදි පිළිවෙලින්
ප්‍රස්තාර කරනවා

ප්‍රස්තාර ඉහළටත්
පහළටත් දුවනවා
හිටි ගමන් ශූන්‍ය වී
තුරුණු සිත් අඬනවා

Facebook YouTube
Tiktok ය කියනවා
Like හා Comment වගු
ප්‍රස්තාර කරනවා

එකිනෙකා පරයනා
සංඛ්‍යාන තියෙනවා
ඉලක්කය පසු හඹා
තුරුණු සිත් තැවෙනවා

Like හා Commentම ද
ජීවිතය කියන්නේ?
විචල්‍යයක් විය යුතු ම
බවකි දැන් පෙනෙන්නේ

තාක්ෂණ ලෝකයේ
ශූන්‍ය වී මිනිස්කම
ධන අගය රැඳෙන්නේ
Online මත ම ඇයි?

මිනිස්කම රැකගන්න
පෙළගැසෙමු පෙළගැසෙමු

උමේෂා ගිම්හානි වික්‍රමතිලක
දෙවන වසර










ශෂිනි අචලිකා
තෙවන වසර



“Science is a wonderful thing if one does not have to earn one’s living at it”

- Albert Einstine -



සංඛ්‍යාන සරණිය මාර්තු - 2022

# සංඛ්‍යානයේ තාක්ෂණික සබැඳියාව

ප්‍රස්තාර ලඝුගණක හැමදේම මොඩ් වෙලා
අනුකලන පිටු අතර ඇත ඔහේ තනි වෙලා
කුප්පි බංකුව ළඟට එක් වුනත් අපි එදා
ඇඟිලි තුඩු අතරටයි දැන් එන්නෙ සැමදෙනා

සංඛ්‍යාත බහුඅස්‍ර ඇන්දෙ හිත පිරෙනකම්
එච්චරට ඕනෙ නෑ පරිගණකෙ බලාපං
දත්ත ටික Enter කර Button එක ඔබාපං
මැවෙන හැටි බහුඅස්‍ර ඇද නැතිව ඩිංගක්

Probability හොයන්නට හැමතැනම දිව්වත්
පිටු ගණන් පෙරළමින් කරුණු ගොඩ කෙරුවත්
Lecture ව හොය හොයා මඟ රැකන් උන්නත්
සියල්ලම ගෙනත් දී අත ළඟට වරමක්

පරණ පොත්වල මිහිරි සුවඳ නොදැනුනාවේ
රතු පාට ලොකු හරිය පොතේ නොඇඳුනාවේ
Cal අරන් තරඟයට ගණන් නොහැඳුනාවේ
කළු ලෑල්ලේ මතක පමණක්ම වුණාවේ

ලෝකයම දිව යන්නේ හයිබ්‍රිඩ් වේගෙන්
ලතැවෙවී ඉන්න බෑ කාලෙ මට මසුරන්
අවකලන අනුකලන විචලතා හොයමින්
සංකරණ හොයමු අපි technology සමඟින්

තාක්ෂණයත් එක්ක තුරුණු අපි මුසු වෙලා
Sampling කරන්නට යන්නෙ නෑ වැඩි වෙලා
දැක්කොතින් උන්නතිය සංඛ්‍යානයේ පියා
පුදුම වෙයි සතුටු වෙයි අමුතු ලොව දැකබලා

නවෝදි වසුන්දරා
දෙවන වසර



# සංඛ්‍යානයෙන් දිවිමග දිනුවෝ



**ගයා අදිකාරි මෙනවිය**
**පරිපාලන සේවය ☞**
**අධ්‍යක්ෂ (සංවර්ධන), සංචාරක අමාත්‍යාංශය**

**ඇය...**

**ගයා අදිකාරි නමින්, අප හඳුනා ගන්නා ඇය වර්ෂ (1984) දී, අබේරත්න අදිකාරි සහ කරුණා අදිකාරි යන දෙමාපියන්ට ආදරණීය දියණිය ව මෙලොව උපත ලබන්නී ය. කුලියාපිටිය ඇස්සැද්දුම සුභාරතී විද්‍යාලය සහ කුරුණෑගල ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලය යන විද්‍යාලයන්ගෙන් සිය මූලික අධ්‍යාපනය නිමා කරන ඇය, අනතුරු ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයෙන් ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ විශේෂවේදී උපාධියත්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ගැනීමට සමත් විය. ඇය වර්තමානයේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අවසන් වසර නීතිවේදී උපාධි අපේක්ෂිකාවක ලෙස සිය අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටියි.**

**වර්ෂ (2012) දී, ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වන ඇය, පුත්තලම දිස්ත්‍රික්කය භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරිය ලෙස සිය රාජකාරි දිවිය ආරම්භ කරනු ලබයි. අනතුරු ව වසර 7ක් පුරාවට ජනාධිපති සහකාර ලේකම්වරියක ලෙස කටයුතු කොට, වර්තමානයේ දී සංචාරක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරේ රාජකාරි ඉටු කරමින් සිටියි.**

මානව ප්‍රාග්ධනය තුළ සක්‍රිය සාමාජිකයකු වීම උදෙසා විදුදයෙන් ලද පන්නරය...

යම් රටකට (හෝ සංවිධානයකට), වටිනාකම හෝ පිරිවැය සැලකීමේ දී, යම් පුද්ගලයෙකු (හෝ ජනගහනයක්) සතු කුසලතා, දැනුම, පළපුරුද්ද සහ ආකල්ප සරල වශයෙන් "මානව ප්‍රාග්ධනය" ලෙස හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාව, සිය මානව ප්‍රාග්ධන සංවර්ධනය උදෙසා නිදහස් අධ්‍යාපනය ද, නිදහස් සෞඛ්‍ය ද වෙනුවෙන්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සැලකිය යුතු වැය බරක් දරනු ලබයි.

නිදහස් අධ්‍යාපනයේ පූර්ණ ප්‍රතිලාභියකු වශයෙන්, මෙරට මානව ප්‍රාග්ධනය තුළ අපගේ කාර්යභාරය ඉටු කිරීමෙහි ලා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ද, විශේෂයෙන් සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයෙන් ද ලද පන්නරය සිහිපත් කිරීමට ලද අවස්ථාවට ප්‍රථමයෙන් කෘතවේදීත්වය පළ කරමි.

**"මෙම විශ්වවිද්‍යාලයෙන් පොතේ ගුරුන් පිරිසක් බිහි වේවායි අපි බලාපොරොත්තු නොවෙමු. කියන දේ එසේ ම පිළිගන්නා, විවේචනයට අකමැති පිරිසක් බලාපොරොත්තු නොවෙමු. ඇති අගුණ වසාගෙන, නැති ගුණ රැවා පෙන්වන කුහකයින් පිරිසක් බලාපොරොත්තු නොවෙමු. නැවෙන් ගොඩ බෑ හැටියේ විදේශීය භාණ්ඩ වැනි මෙරටට අමුතු වූ මෙහි සභ්‍යත්වය නොදන්නා කෘත්‍රිම රූකඩයන් පිරිසක් බලාපොරොත්තු නොවෙමු. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් විනෝද විය යුතු යි. විවේචනශීලී විය යුතු යි. ගවේෂී විය යුතු යි. එහෙත් ඒ හැම තැනම, සත්‍යගරුක විය යුතු යි. යුක්තිගරුක විය යුතු යි. බුද්ධිමත් විය යුතු යි. ශිෂ්ට විය යුතු යි. සත්‍ය විය යුතු යි. සීමාන්තික නොවිය යුතු යි."**

සාහිත්‍ය සූරී, සාහිත්‍ය චක්‍රවර්ති පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ
සෝරතාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
(ප්‍රථම උපකුලපති - විද්‍යෝදය විශ්වවිද්‍යාලය)

වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් විද්‍යෝදය ගුරුකුලය විෂයයෙහි සිදු කරන ලද ඉහත ප්‍රකාශය රටක මානව ප්‍රාග්ධනය කෙසේ සකස් විය යුතු ද යන්න සම්බන්ධයෙන් විචක්ෂණ පරිකල්පනයකින් ලියවුණු පරිපූර්ණ විශ්ලේෂණයකි. එකී ප්‍රකාශනය මගින් මානව ප්‍රාග්ධනය දැනුමෙන් සහ ආකල්පවලින් පරිපූර්ණ විය යුත්තේ කෙසේ ද යන්න මනාව පැහැදිලි කරයි.

අපගේ ශාස්ත්‍රීය ගමන්මග ද, පසුකලෙක, වෘත්තීය ගමන්මග ද, සමස්ත ජීවන සැකැස්ම ද බොහෝ විට තීරණය වූයේ මෙම දර්ශනය මත ය. ඒ විදුදයෙන් ලද පන්නරය යි.

වර්ෂ (2005) දී සරසවි වරම් ලබා සිව් වසරක් පුරාවට විදුදය තුළ ගත කළ ශාස්ත්‍රීය චාරිකාව, සංඛ්‍යාන විෂය පාදක කරගත්තක් වුව ද, කිසිසේත් සංඛ්‍යා අතර සිරවූවක් නම් නොවීය. අනෙක් කිසිදු අංශයකට නොදෙවෙනි ලෙසට කලාව, සාහිත්‍යය පමණක් නොව විචක්ෂණ දේශපාලන විවරණයන් ද, අපගේ සමාගමයන් සහ බුද්ධිමය සංවාදයන් තුළ ආගන්තුක නොවී ය. සාමාජිකයින් 10 කට නොවැඩි වූ ඇඳුරු මඬුල්ල ද සහෝදරයින් දෙදෙනෙකුගෙන් (මංජු, විජිත) සහ සහෝදරියන් දොළොස් දෙදෙනෙකුගෙන් (ගීතිකා, සඳුනි, අමාලි, සේනානි, සුරංගි, චමිලා, චාන්දනී) සමන්විත වූ අප කණ්ඩායම ද සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය තුළ කුඩා පවුලක් බවට පත් විය. එකී සිව් වසරක ශාස්ත්‍රීය චාරිකාව, එකිනෙකා අතර අද පවා අත් නොහැරී පවතින සහෝදරත්වයක් ද සහයෝගයක් ද ගොඩනගන ලද ශාස්ත්‍රීය ගවේෂණයකි. මෙම කුඩා කණ්ඩායම සෙසු විශ්වවිද්‍යාල ප්‍රජාව සමග ද, ඉතා සහයෝගයෙන්, විනෝදයෙන් කටයුතු කළ අතර විදුදය තුළ බෙදා හදා ගත් එම සොඳුරු මතකයන් ආවර්ජනය කිරීම, අද පවා සිතට නැවුම් සිසිලක් එක් කරයි. නළ මුදු සුවඳ, විදුදය අවුරුදු අසිරිය, සැඳෑ ගී සාදයන්, ක්‍රීඩා උත්සව ආදිය ශාස්ත්‍රීය ගවේෂණයෙන් ඔබ්බට අපගේ පෞරුෂයන් තුළ විවිධ හැඩතල නිර්මාණය කළ බව සටහන් කර තැබිය යුතු ම යි.

විදුදය තුළ ගත කළ සිව් වසරක කාල පරිච්ඡේදය තුළ පෞද්ගලික ව මා අත්පත් කර ගත් යමක් තිබේ නම්, ඊට ද වඩා කණ්ඩායමක් ලෙස අප අත් පත් කර ගත් දේ සම්බන්ධයෙන් මම අද ද වඩා ප්‍රීතියට පත් වෙමි. ඒ අප විදුදය තුළ ගොඩ නගන ලද හර වටිනාකම් පද්ධතිය යි (value system). ඉතා දිගු විරාමයකින් පසු (මගේ මතකය නිවැරදි නම් වසර 10 කට පසු), මානවශාස්ත්‍ර සමාජීයවිද්‍යා පීඨයේ ප්‍රථමයා, සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශයෙන් බිහි කිරීම ද, අප කණ්ඩායමේ සියලු දෙනා විශිෂ්ට සාමාර්ථයන් සහිත ව විද්‍යාර්ථීන් බවට පත් වීම ද සමස්ත සරසවි ජීවිතය පුරාවට සුන්දර ම මතකයන් ය.

උපාධි නිබන්ධනය භාර දුන් (2009) වසරේ ජූලි මස (31) වන දිනට පසුව එළඹි පළමු වැඩ කරන දිනයේ සිට ම, අධ්‍යයනාංශය වෙත ලද අවස්ථාවක් වශයෙන් තවත් සොයුරියන් දෙදෙනෙකු (ගීතිකා සහ රුක්ෂිලා) සමඟ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක (IRQUE - Improving Relevance and Quality of Undergraduate Education in Sri Lanka) පර්යේෂණ සහායිකාවක ලෙස කටයුතු කරන්නට අවස්ථාව උදා විය. මෙය, ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ විශේෂවේදී උපාධිය රැකියා වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට (employability requirements of the job market මනාව ගලපා තිබූ බවට කදිම නිදසුනකි.

ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ විශේෂවේදී උපාධිධාරිනියක ලෙස, අපගේ විධිමත් වෘත්තීය ජීවිතය ආරම්භ කරනු ලබන්නේ, 2012 වසරේ ජනවාරි මස (02) වන දින, ශ්‍රී ලංකා පරිපාලන සේවා නලධාරිනියක ලෙස පත්වීම් ලැබීමත් සමඟ යි. විද්‍යෝදය විශ්වවිද්‍යාලය යනු සෝරත දර්ශනය යථාර්තවත් කරමින්, දශක ගණනාවක් පුරාවට මෙරට රාජ්‍ය පරිපාලනයේ සෑම ක්ෂේත්‍රයක් තුළ ම සිය ගණනක් පරිපාලකයින් බිහි කළ විද්‍යාස්ථානයකි. කෙසේ වෙතත්, මගේ දැනුම නිවැරදි නම්, සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය නියෝජනය කරමින් එකී සුවිශේෂී ආදී විද්‍යාර්ථීන් කුලකය නියෝජනය කරනු ලබන පළමු වැන්නා බවට පත්වීමට අප භාග්‍යවන්ත වන අතරේ දී ම, ඒ මාවතේ දෙවැන්නන් ද, පිය මැන එනු දැක, අපි වඩාත් සතුටු වෙමු.

**"මානුෂිකවාදී හැඟීම් හා ගොවියාගේ හදවතේ රිද්මය හඳුනාගත්, ඔබ වැනි ජාතික ධනයෙන් නිදහස් අධ්‍යාපනය ලබා නැවත එම ලැබූ අධ්‍යාපනයේ බල මහිමයෙන් ඔබ සතු ව ඇති "අධිකාරි බලය" උපයෝගී කරගෙන මා වැනි දුප්පත් ගොවියෙකුට කළ අමිල මෙහෙවරට මාගේ අවංක උපහාරය පිළිගන්වමි. ඔබට පමණක් නොව ඔබ වැනි අවංක නිහතමානී රාජ්‍ය නිළධාරීන් මෙලොවට බිහි කළ දෙමාපියන්ට ද ප්‍රණාමය පුද කරමි."**

එල්. ඩී සුමනසේකර
පෙරියකට්ටකඩුව, ආඬිගම
2014.01.09

වසරක පමණ කාලයක දීර්ඝ සේවාස්ථ පුහුණුවකින් පසු, පුත්තලම දිස්ත්‍රික්කය භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරිය ලෙස රාජකාරි ආරම්භ කොට වසර එකහමාරක පමණ කෙටි කලකින්, රාජකාරිය ඉක්මවා සේවයට කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස ලද මෙම සටහන, අපගේ පෞරුෂය ද, අප විසින් ගොඩනගන ලද හර පද්ධතිය ද, එහි පංගුකරුවන් ද පිළිබඳ ව අහිංසක ගැමියෙකුගේ ප්‍රශස්ත කියවීමකි. අප පිළිබඳ අයිතිවාසිකම් ලිවීමේ දී, නිදහස් අධ්‍යාපනය සඳහා දායකත්වය දක්වන ලද සියලු ම පුරවැසියන් සතු අයිතිය අමතක නොකළ යුතු යි. එම අයිතිය සම්බන්ධයෙන්, ඔවුන් අප දෙස කොතරම් නම් විමසිලිමත් ද යන්න ඉහත ප්‍රකාශය මනාව පසක් කර දෙයි. ඔවුන්ගේ මිනුම්දඬු තුළ අප පමණක් නොව, අප මෙලොවට බිහි කළ ආදරණීය දෙමාපියන් ද, මග හසර කියා දුන් විද්‍යාස්ථානයන් සහ ආදරණීය ගුරු දෙමාපියන් ද, සමස්ත වශයෙන් අප විසින් ගොඩනගන ලද හර පද්ධතිය ද ඇගයීමට ලක් වේ. දෙමාපිය ඇසුරේ අප විසින් උකහා ගන්නා ලද වටිනාකම් ද, පසුකලෙක අප ගමන්මග ඔපවත් කළා වූ සියලු විද්‍යාස්ථානයන්ගෙන් ලද පන්නරය නිසාවෙන්, පොදු මිනිසාගේ ඇගයීම් තුළ මනුෂ්‍යත්වය හඳුනාගත් මිනිසකු වීමට ලැබීම සම්බන්ධයෙන් මම නිහතමානී ව සතුටු වෙමි.

රාජකාරී ජීවිතයේ මීළඟ සුවිශේෂී නවාතැන ජනාධිපති ලේකම් කාර්යාලය යි. ජනාධිපති සහකාර ලේකම්වරියක ලෙස, පුරා සත් වසක් ලාංකීය රාජ්‍ය පාලනයේ විධායකය වෙත ව්‍යවස්ථානුකූල ව පැවරෙන ලද රාජකාරී මෙන්ම සංවර්ධන ප්‍රමුඛතාවයන් ක්‍රියාත්මක කිරීමෙහි ලා කටයුතු කරන්නට ද, පහසුකම් සලසන්නට ද ලද අවස්ථාව, ඉදිරි රාජකාරි දිශානතිය වඩා පරිණත ඉසව්වකට යොමු කළ වග ලියා තැබිය යුතු ම ය.

**නොදී පීඩා නිල බලෙන් -**
**නව වසක් පුරාවට -**
**ලක් දෙරණ දිනවන්නට -**
**ඔබෙන් ලද මෙහෙවරට -**
**තුති පුදමු ආදරෙන්...**

නිල බලයෙන් හිස උදුම්වා නොගෙන, අප වෙත පැවරෙන ලද මෙහෙවර නිරන්තරයෙන් නිසි පරිදි ඉටු කරන්නට ගොඩනගා ගන්නා ලද පෞරුෂය, ජනාධිපති කාර්යාලයේ සත් වසක සේවය නිමවා, සමුගන්නා මොහොතේ ලද එම සමුගැනීම් සටහන තුළ, මනා ව සටහන් වී තිබුණි. ළමා කාලයේ දී පවුල සහ පාසල තුළ ලද අත්දැකීම් මෙන් ම පසු කලෙක අපගේ තුරුණු ජීවිතය හැඩ ගැන් වූ සරසවියෙන් ලද පන්නරය ද වර්තමානයේ දී සමාජය විසින් හඳුනා ගනු ලබන අපගේ පුද්ගල පෞරුෂය ගොඩනැගීමෙහි ලා සුවිශේෂී ලෙස දායක වූ බව සටහන් කළ යුතු ම ය.

විශේෂයෙන් මානව ප්‍රාග්ධනය තුළ සමබර පෞරුෂයක් ගොඩැනැගීම සඳහා දැනුම, කුසලතා මෙන් ම ආකල්ප ඉතා වැදගත් වේ. එකී පෞරුෂය ගොඩනැගීමේ දී, යමෙකු ජීවත් වන සමාජ පරිසරය සේ ම, අඛණ්ඩ අධ්‍යාපනය ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කොතරම් වයස්ගත වුව ද, කුමන නිල තත්ත්වයක් දැරුව ද, දැනුම සොයා යෑමේ අවශ්‍යතාව ද ඒ සඳහා වන කැමැත්ත ද අත් හළ නොහැකි වග මම දැඩිව විශ්වාස කරමි. විධිමත් අධ්‍යාපනය තුළ අඛණ්ඩ ව නියැලෙමින් ද, විවිධ විෂයය ක්ෂේත්‍රයන් තුළ ප්‍රායෝගික ව ලබා ගන්නා අත්දැකීම් ආශ්‍රයෙන් ද ගොඩනගනු ලබන දැනුම අපගේ චින්තන පරාසය පුළුල් කරන්නට මහඟු පිටිවහලකි.

විවිධ විෂයය ක්ෂේත්‍රයන් තුළ ප්‍රායෝගික දැනුම සොයා යාමේ වර්තමාන නවාතැන, සංචාරක අමාත්‍යාංශය යි. ආර්ථික වශයෙන් රට ඉතාමත් අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් පසු කරමින් සිටින මොහොතක, විදේශ විනිමය ඉපයීම් කෙරෙහි ඍජු දායකත්වයක් දක්වනු ලබන සංචාරක කර්මාන්තයට අදාළ රජයේ ප්‍රධාන නියාමන කාර්යභාරය ඉටු කරනු ලබන සංචාරක අමාත්‍යාංශයේ, සංවර්ධන විෂයය භාර අධ්‍යක්ෂවරිය ලෙස අප වෙත වගකීම් පැවරී ඇත. මේ එළඹුම, එම වගකීම උදෙසා වගවීමට යි. එනම්, මේ දක්වා කාල පරිච්ඡේදය තුළ අප විසින් අත්පත් කරගන්නා ලද සෛද්ධාන්තික දැනුම ද, ප්‍රායෝගික අත්දැකීම් ද රටට අවශ්‍යම මොහොතක අවශ්‍ය ම ක්ෂේත්‍රයක ආයෝජනය කිරීම සඳහා යි.

ගෙවී ගිය දස වසරක කාලයේ දී, රාජ්‍ය අංශයේ විධායක නලධාරිණියක ලෙස මගේ අත්දැකීම, රාජ්‍ය පරිපාලනය තුළ සාමාන්‍යවාදියෙකු (Generalist) ලෙස ක්‍රියාත්මක වීමේ දී, තීරණ ගැනීමේ ක්‍රියාවලියට, විවේචනාත්මක විශ්ලේෂණය (critical analysis) ද, තාර්කික මනසක් (logical mind) පැවතීම ද, ඉතා අත්‍යවශ්‍ය වන බව යි. ශ්‍රී ලංකා පරිපාලන සේවා විභාගය සමත්වීමේ සිට මේ දක්වා අප පැමිණි ගමන්මගේ, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ දී, සංඛ්‍යාන විෂයය තුළ ලද අප ලද විෂයානුබද්ධ අවබෝධය ද, ඒ ආශ්‍රිත ව ගොඩනැගෙන සෙසු කුසලතාවන් ද එහිදී ඉහළ දායකත්වයක් ලබා දුන් වග සටහන් කර තැබිය යුතු ය.

**පසු සටහන**

හෙට උපදින පරම්පරාවේ වර්තමාන වගකීම උර මත දරා සිටින කුලකයේ සාමාජිකාවක ලෙස, එකී වගකීම උපරිමයෙන් ඉටු කිරීම සඳහා වගවීම ද, කැපවීම ද හෙට දවස පිළිබඳ අපගේ බලාපොරොත්තුව යි. එකී ගමන්මගේ පියවර ඔසවන්නට දිරි බල සපයන මගේ ආදරණීය දෙමාපියන් ඇතුළු සියලු ම පාත්‍ර වර්ගයා කෘතවේදී ව සිහිපත් කරමි.









*"What I did in my youth is hundreds of times easier today. Technology breeds crime"*

*- Frank Abagnale -*




අමාශා උදේශානි
සිව්වන වසර

# නව නිපැයුම් හා අපේ තරුණ පරපුර

ආසියා මහාද්වීපයේ අති රමණීය රටක් ලෙසින් ලොවකගේ සිත් දිනා ඇති ශ්‍රී ලංකාව නෙකවර්ණ දක්ෂතාවන්ගෙන් පිරුණු තාරුණ්‍යයක් සහිත රන් බිමකි. එහි සැකයක් නොමැති බව ලක්බිමේ දූ පුතුන් තාක්ෂණය හා ඒකාත්මික වෙමින් බිහි කළ නවෝත්පාදන සාක්ෂි දරති. එදා පැරැණ්නෝ දැතේ වීර්යයෙන්, ගතේ වෙහෙසින් සිදු කළ නොයෙකුත් බැරෑරුම් කර්තව්‍යයන් අද වන විට යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් සිදු කිරීමට තරම් තාක්ෂණයේ නිම් වළලු පුළුල් වී හමාර ය. එදා සිට අද දක්වා තාක්ෂණයේ දියුණුව ප්‍රස්තාර ගත කළ හොත් නිසැකයෙන් ම එය අනුලෝම ව වර්ධනය වන්නක් බව හඳුනා ගැනීමට හැකි ය.



තාක්ෂණය මිනිසා සමඟ ඒකාත්මික වීම ඇරඹුණේ ලොව ම කාර්මීකරණයකට ලක් වීමත් සමඟ යි. එතැන් සිට දියුණුවෙමින් පැවත එන තාක්ෂණය කෘත්‍රිම බුද්ධියෙන් යුතු රොබෝවරු නිර්මාණය අභිබවා යමින් පවතින තත්ත්වයකට අද පත් ව ඇත. ලාංකීය සමාජය තුළ ද තාක්ෂණය හා ගැටෙමින් නව නිර්මාණ කිරීමට දැඩි ඇල්මකින් පසුවන යොවුන් පරපුරක් සිටින බව වැඩි වශයෙන් අනාවරණය වූයේ ලෝකයා ම පීඩාවට පත් කළ කොරෝනා වසංගතයත් සමඟ ය. එහෙත් ඊට පෙර සිට ම විවිධ වූ නිර්මාණයන් කරළියට ගෙන ඒමට කටයුතු කළ තරුණ පිරිස් ද සමාජය තුළ සිටි බව විවිධ මාධ්‍යයන් මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලින් අනාවරණය විය.

ඒ අනුව විවිධ මාධ්‍යයන් මඟින් ලබා ගන්නා ලද තොරතුරු මූලික කරගෙන තාක්ෂණය යොදාගෙන නවමු නිර්මාණකරණයන් ලොවට දායාද කළ ලාංකීය තරුණ තරුණියන් කිහිපදෙනෙක් සහ ඔවුන්ගේ නවෝත්පාදනයන් පිළිබඳ තොරතුරු සංඛ්‍යාන සරණිය දෙවන වෙළුමෙහි දෙවන කලාපය මඟින් ඉදිරිපත් කෙරෙන මෙම ලිපිය මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ අතර එමඟින් තවදුරටත් ලාංකිය තරුණ තරුණියන්ගේ නවමු නිර්මාණකරණය අභිප්‍රේරණය කිරීමට අපේක්ෂා කළෙමි.

ඒ අනුව තාක්ෂණය හා බද්ධ ව කොටස් එකලැස් කරමින් මෝටර් රථයක් නිෂ්පාදනය කිරීමට ශ්‍රී රාහුල ජාතික පාසලේ ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව හැදෑරූ රුක්ෂාන් නින්නාද සිසුවා සමත් වී තිබුණි. එහි දී ඔහු පරණ ත්‍රිරෝද රථයක එන්ජිම ඉවත් කොට ක්ලච් එක සහ ගියර් පද්ධතිය අලුතින් සවි කිරීමටත්, පිටුපස රෝද දෙකට සමානන්තර ව ඉදිරිපස රෝදය සවි කොට අලුත් තිරිංග පද්ධතියක් සවි කිරීමටත්, අමානෝ තහඩු මිලට ගෙන වාහනයේ සැකිල්ලට අනුව තහඩු නවා එය නිර්මාණාත්මකව සකස් කිරීමටත්, අසුන් සකස් කිරීමටත් ක්‍රියා කොට තිබුණි. එමෙන් ම පානදුර ප්‍රදේශයේ, මොරටුව වේල්ස් කුමාර විද්‍යාලයෙන් සහ හොරණ තක්ෂිලා විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇති භූෂිත සෙහාන් ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට අංග සම්පූර්ණ බර යන්ත්‍රෝපකරණයක් නිෂ්පාදනය කිරීමට සමත් විය. ඔහු නිපදවන ලද බර යන්ත්‍රෝපකරණය වූයේ එක්ස්කැවේටර් යන්ත්‍රයකි. 6 ශ්‍රේණියේ සිට නව නිපැයුම් නිර්මාණයේ දස්කම්පාන ලද සෙහාන්ගේ මුල් ම නිපැයුම වූයේ මකුළු දැල් කඩන යන්ත්‍රයක් සකස් කිරීම යි. පසු ව ඔහු රිජිෆෝම් සහ ඇන්ටනා බට, පැන් බට යොදාගෙන ඒ කාලයේ දී ම එක්ස්කැවේටර් ආකෘතියක් නිර්මාණය කරනු ලැබූ අතර එය සජීවී නිර්මාණයක් බවට පරිවර්තනය කරන ලද්දේ උසස් පෙළ විභාගය කොට ගෙදර සිටින කාලයේ දී ය. 2014 වර්ෂයේ දී යන්ත්‍රය සෑදීමට පටන් ගත් සෙහාන්ට 2015 මුල් මාසවල දී පමණ එය අවසන් කිරීමට හැකියාව ලැබී ඇත. මෙය නිපදවීමට අවශ්‍ය සියලු දැනුම ඔහු අන්තර්ජාලය ඇසුරින් සොයාගෙන තිබුණි. එපමණක් නොව රත්නපුර ගෝනකුඹුර ප්‍රදේශයේ පදිංචි තරුෂි විදුෂිකා රාජපක්ෂ සිය නිර්මාණශීලී හැකියාව උපයෝගී කර ගනිමින් නව නිර්මාණ 17 ක් ඉදිරිපත් කොට තිබුණි. තමන් උසස් අධ්‍යාපනය ලබන අවධියේ ඉදිරිපත් කළ මෙම නව නිර්මාණ අතුරින් කිහිපයකට ම පේටන්ට් බලපත්‍රය පවා හිමි ව ඇත. ඇය විසින් නිපදවනු ලැබූ නව නිපැයුම් ලෙස ගෘහණියන්ට හොඳි හැඳි ගෑම පහසු කරන යන්ත්‍රයක්, රාහු කාලය පෙන්වන ඔරලෝසුවක්, විෂබීජ නාශක බල්බයක් යොදා ගනිමින් විෂබීජ නාශක මිනී පෙට්ටියක්, පෙරහැරක දී අඟුරු පෑගී කුලප්පු වන අලි ඇතුන්ට කුලප්පු වීම වැළැක්වීමට සපත්තුවක්, වතුර ටැංකිවල ජල මට්ටම පාලනය කරන ස්විචයක්, මීයන් සඳහා උගුලක්, මදුරු කීට උගුලක් සහ පෙදරේරුවන්ට තරප්පු පෙළ මතින් රැගෙන යා හැකි විල්බැරෝවක් දැක්විය හැකි ය. මීට අමතරව ලන්ෂීට් වෙනුවට පරිසර හිතකාමී ලෙස නිෂ්පාදිත බෑගයක්, පාපැදියක කොටස් එකතු කරමින් වැඩිදියුණු කරන ලද මෝටර් සයිකලයක් පවා ඇය විසින් නිපදවා ඇත.

එමෙන් ම කොරෝනා වසංගතයත් සමඟ නව නිර්මාණ ඉදිරිපත් කිරීමට කටයුතු කළ පුද්ගලයන් අතුරින් රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර සඳහා සහාය ලබා දෙන රොබෝ යන්ත්‍රයක්, MAS Intimates ආයතනයේ ඉංජිනේරුවරයෙකු වූ මදුර දිසානායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් නිපදවන ලදී. රෝගීන්ට අවශ්‍ය ඖෂධ, ආහාර සෞඛ්‍ය උපදෙස් ඇතුළත් කාර්යය පත්‍රිකා ලබා දීමේ හැකියාව මෙම රොබෝ යන්ත්‍රය සතු විය. එමෙන් ම කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිව්වන වසර ඉගෙනුම ලැබූ දිල්ෂාන් අබේවර්ධන ශිෂ්‍යයා විසින් හෘදය අකර්මණ්‍ය වීමක දී හදවතට යාන්ත්‍රික සම්බාහනයක් ලබා දීම සඳහා M-CPR යන්ත්‍රය නිපදවනු ලැබුවේ ය. මෙම යන්ත්‍රය මඟින් රෝගියා හා වෛද්‍යවරයා අතර පරතරය නිසි ලෙස පවත්වාගෙන යමින් හදවත අකර්මණ්‍ය වී මිය ගොස් ඇති රෝගීයකුගේ හදවතට යාන්ත්‍රිකව මාසාජ් කිරීමක් සිදු කරනු ලැබේ. කොරෝනා වෛරස ආසාදිතයන් හඳුනාගැනීම සඳහා සිදු කරන පරීක්ෂාව PCR පරීක්ෂාව ලෙස හඳුන්වයි. මෙම පරීක්ෂාව සිදු කිරීමට PCR යන්ත්‍රයක් ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ උෂාන් සකුන්ත විසින් දේශීය ව නිෂ්පාදනය කරනු ලැබුවේ ය. මෙම යන්ත්‍රයෙන් එකවර නියැදි 12 ක් පරීක්ෂා කළ හැකි වූ අතර එය නියැදි 25 දක්වා වැඩි කළ හැකි අතර PCR යන්ත්‍ර සඳහා භාවිත කරන නවීනතම තාක්ෂණය මේ සඳහා ද භාවිත කොට තිබුණි.

මේ අයුරින් කොරෝනා වසංගතයට පෙර සිට සහ කොරෝනා වසංගතයත් සමඟ වඩාත් තීව්‍ර වූ නව නිපැයුම් බිහි කිරීමේ ක්‍රියාවලිය තුළින් අප රටේ තරුණ තරුණියන්ගේ හැකියාව මනාවට පිළිබිඹු වේ. මෙහි දී අවධාරණයට ලක් කළ හැකි කරුණු කිහිපයක් වනුයේ නව නිර්මාණකරණයන්ට වයස් භේදයක් නොමැති බවත්, තාක්ෂණික උපකරණ බිහි කිරීමට අවශ්‍ය දැනුම අන්තර්ජාලය හරහා ලබා ගත හැකි බවත් ය. ඒ අනුව මෙම ලිපිය කියවන ඔබත් ලාංකීය නාමය ලොවක් ඉදිරියේ තැබිය හැකි තාක්ෂණය හා ඒකාත්මික වූ නව නිපැයුම් බිහි කරලීම කලාවක් කිරීමට උත්සහ කරනු ඇත!


මූලාශ්‍ර:

කොරෝනා මැද බිහිවන නව නිපැයුම් (www.roar.media.com,2020.05.15)

කොටස් එකලස් කර සාර්ථකව මෝටර් රථයක් හැදූ පාසල් සිසුවා ( Made in Sri Lanka News, www. srilankabrand.info.lk)

ශ්‍රී ලංකාවේ ප්‍රථමවතාවට අංග සම්පූර්ණ බර යන්ත්‍රෝපකරණයක් හදපු පානදුරේ භූෂිත (Made in Sri Lanka News, www. srilankabrand.info.lk)

නව නිපැයුම් 17 කට හිමිකම් කියන පුංචි තරුෂි (Made in Sri Lanka News, www. srilankabrand.info.lk)

කොරෝනා මඩින්න ශ්‍රී ලාංකික නව නිපැයුම් (www.runews.lk, 2020-04-05)





හරිනි මධූෂා
සිව්වන වසර

# දැනුමට බිඳක්

01. සංඛ්‍යාන දත්තවලට අනුව 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතර වඩාත් ම ජනප්‍රිය සමාජ මාධ්‍ය ජාලය කුමක් ද?
(What was the most popular Social media platform in 2021 among youth in Sri Lanka according to statistics?)

I. YouTube
II. Instagram
III. Facebook
IV. Tiktok

02. ශ්‍රී ලංකාවේ රැකියා විරහිත තරුණ ප්‍රජාව (2020 වර්ෂය) සැලකීමේ දී ඔවුන්ගේ පරිගණක සාක්ෂරතා අනුපාතය කොපමණ ද? (What is the computer literacy rate in 2020 of the unemployed youth community in Sri Lanka?)

I. 79.2%
II. 65.2%
III. 67.9%
IV. 78.3%

03. වඩාත් ම ප්‍රචලිත ගුප්තකේතක මුදල් වර්ගය කුමක් ද? (What is the most popular cryptocurrency?)

I. Bitcoin Cash
II. Bitcoin
III. Dogecoin
IV. Ethereum

04. දකුණු ආසියාවේ පූර්ණ ඉලෙක්ට්‍රොනික මෝටර් රථ නව නිපැයුම කුමක් ද?(What is South Asia's fully electronic automobile innovation?)

I. මයික්‍රෝ (Micro)
II. ඇකියුරා (Acura)
III. වේගා (Vega)
IV. ඩීමෝ (Dimo)

05. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතරින් 2021 වර්ෂයේ නව නිපැයුම් සමීක්ෂණ අනුව ඉදිරියෙන් ම සිටින විශ්වවිද්‍යාලය වන්නේ? (Which state university in Sri Lanka is leading in innovation research in 2021?)

I. කොළඹ විශ්වවිද්‍යාලය (University of Colombo)
II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (University of Sri Jayewardenepura)
III. පේරාදෙණිය විශ්වවිද්‍යාලය (University of Peradeniya)
IV. මොරටුව විශ්වවිද්‍යාලය (University of Moratuwa)





06. 2021 වසර වන විට ඉදිරියෙන් ම සිටින තාක්ෂණික සමාගම කුමක් ද? (What is the leading tech Company in the world in the year 2021?)

I. Apple
II. Samsung
III. Huawei
IV. Google

07. ලොව ලාබාලතම අභ්‍යවකාශ සංචාරකයා කවුද? (Who is the youngest space traveller?)

I. චාර්ල්ස් ඩියුක් (Charles Duke)
II. වැලන්ටිනා තෙරෙෂොක්වා (Valentina Tereshokva)
III. ජෝන් ග්ලෙන් (John Glenn)
IV. ඔලිවර් ඩේමන් (Oliver Daemen)

08. ජෛව ඉන්ධන මඟින් බලගැන්වෙන ලොව ප්‍රථම රොකට්ටුවක් මඟින් චන්ද්‍රිකාවක් දියත් කළ ලොව පළමු රට වන්නේ? (Which country launched satellites using the world's first rocket powered by bio-fuel?)

I. රුසියාව (Russia)
II. එක්සත් ජනපදය (United States)
III. චීනය (China)
IV. ජපානය (Japan)

09. ශ්‍රී ලංකාව තුළ නිර්මිත ප්‍රථම විද්‍යුත් වාණිජ වෙබ් අඩවිය කුමක් ද? (What is the first e-commerce site formed in Sri Lanka?)

I. Daraz.lk
II. Ikman.lk
III. Kapruka.lk
IV. Takas.lk

10. පහත පිළිතුරු අතරින් ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අත්හදා බැලීම් සඳහා ප්‍රමුඛතම නියෝජිත ආයතනය වන්නේ? (Which one of the following is Sri Lanka's leading agency in for implementation of information and communications technology initiatives?)

I. IEEE
II. ICTA
III. Virtusa
IV. IFS

Reference:- https://gs.statcounter.com/social-media-stats/all/sri-lanka






# Puzzle

## Find the technological related words?

In this puzzle, there are 12 hidden words related to technology.
You can find those words horizontally, vertically, diagonally, and backward.

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| I | I | K | O | N | Y | L | H | Z | Z | N | M | A | Q | F | B | J | P | Y | M |
| K | N | D | U | X | W | Y | H | I | Q | Q | L | Y | Q | C | T | Z | C | K | I |
| I | N | F | U | Z | O | T | J | E | G | L | R | O | M | R | O | N | V | X | N |
| O | O | L | O | C | N | I | S | D | B | H | A | O | O | P | E | F | R | D | I |
| E | V | L | O | F | S | L | O | L | A | X | T | B | X | R | H | A | E | B | T |
| H | A | S | R | W | V | A | P | D | P | S | O | E | R | G | J | C | Q | W | A |
| Y | T | G | O | H | Q | E | T | J | F | T | H | U | C | J | N | T | A | R | B |
| R | I | I | S | C | B | R | M | P | I | O | C | Q | B | H | Y | F | R | B | B |
| E | O | I | P | F | I | L | U | C | V | O | M | O | F | G | C | P | G | H | H |
| N | N | Z | Q | Z | N | A | S | E | T | G | G | U | R | H | V | N | A | H | O |
| I | S | B | H | E | S | U | L | P | S | C | I | N | O | R | T | C | E | L | E |
| H | L | I | U | A | B | T | Y | M | E | G | R | O | I | L | W | M | A | V | T |
| C | L | F | H | W | W | R | R | C | E | A | S | L | T | T | K | O | T | D | V |
| A | C | F | A | V | C | I | R | B | F | D | L | S | F | W | U | S | T | A | S |
| M | Y | O | L | A | C | V | I | E | W | L | I | D | O | X | K | P | K | U | E |
| T | E | L | E | C | O | M | M | U | N | I | C | A | T | I | O | N | M | V | S |
| H | R | Q | C | Q | W | J | M | B | P | O | J | T | K | C | Z | L | F | O | S |
| H | Q | B | J | J | V | M | K | L | S | R | I | X | O | S | P | S | S | V | C |
| K | L | I | T | C | J | P | X | M | A | E | L | Y | S | K | I | E | F | M | E |
| F | T | I | G | Q | O | X | R | F | J | P | E | T | V | B | E | T | V | X | Z |

2021 වර්ෂයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය මගින් සංවිධානය කළ 'සිහිනයට අත්වැලක්' උපකාරක සම්මන්ත්‍රණ මාලාවට සමගාමී ව සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නුවන් මදුවංශ මහතා සහ කථිකාචාර්ය සුරේෂ් නාලක මහතා විසින් ඉදිරිපත් කළ වැඩමුළුවට අදාළ ප්‍රශ්න පත්‍රය ඔබ සැමගේ සංඛ්‍යාන දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙලෙස සංඛ්‍යාන සරණිය හරහා ඔබ අතට පත් කරන්නෙමු.





ආදර්ශ ප්‍රශ්න පත්‍රයකි. AL/2021/31/S-I

**' සිහිනයට අත්වැලක් ' උපකාරක සම්මන්ත්‍රණය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021**
**General Certificate of Education (Adv. Level) Examination, 2021**

**ව්‍යාපාර සංඛ්‍යානය I**
**வணிகப் புள்ளிவிபரவியல் I**
**Business Statistics I**

**31 S I**

**පැය දෙකයි**
**இரண்டு மணி நேரம்**
**Two hours**

**උපදෙස්:**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- සංඛ්‍යාන වගු සපයනු ඇත. ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (✕) යොදා දක්වන්න.**

1. පහත දැක්වෙන කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?
   (1) සංඛ්‍යාන අධ්‍යයනයක ප්‍රතිඵල සදාකාලික ව වලංගු නො වේ.
   (2) ගුණාත්මක දත්ත කිරුම්, මිනුම්, ගණන් කිරීම් මගින් මෙන් ම නිරීක්ෂණය කිරීමෙන් ලබා ගත හැකි ය.
   (3) ප්‍රමාණවත් හා සාධාරණ නියැදියක් යොදා නොගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම සංඛ්‍යානයෙහි අවභාවිතයක් වේ.
   (4) සංඛ්‍යාන අධ්‍යයනයක ප්‍රතිඵල ඍජු ව ම අදාළ වන සංගහනය ඉලක්ක සංගහනය ලෙස හඳුන්වයි.
   (5) සංඛ්‍යාන අධ්‍යයන සඳහා යොදා ගනු ලබන්නේ ප්‍රමාණාත්මක දත්ත පමණි.

2. පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
   $A$. ඒකාකාරී අධ්‍යාපන මට්ටමක් සහිත පිරිසකගෙන් දත්ත ලබා ගැනීම සඳහා ස්වයං ගණන් ගැනීමේ ක්‍රමය වඩා යෝග්‍ය වේ.
   $B$. නාභිගත කණ්ඩායම් සාකච්ඡා ක්‍රමය කරුණු වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගත හැකි ය.
   $C$. ස්වයං ගණන් ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කරන අතර අනෙකුත් ක්‍රම සඳහා උපලේඛන භාවිත කෙරේ.
   ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
   (1) $A$ පමණි. (2) $C$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
   (4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

3. පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?
   $A$. පන්ති ප්‍රාන්තරයක සාපේක්ෂ සංඛ්‍යාතය යනු එම පන්ති ප්‍රාන්තරයේ සංඛ්‍යාතය, ව්‍යාප්තියේ මුළු සංඛ්‍යාතයට දරණ අනුපාතය වේ.
   $B$. නිරීක්ෂණ සමූහයක් එක් එක් නිරීක්ෂණයට අනුරූප සංඛ්‍යාතය සමග පෙළගස්වන සටහනක් අසමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් ලෙස හඳුන්වයි.
   $C$. දත්ත විශාල ප්‍රමාණයක් විශාල පරාසයක් තුළ ව්‍යාප්ත ව ඇති විට දත්ත සංවිධානය සඳහා සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තිය වඩාත් යෝග්‍ය වේ.
   ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
   (1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
   (4) $A$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

[ දෙවෙනි පිටුව බලන්න.

4. පහත දැක්වෙන කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?
(1) අසමාන පන්ති සහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් සඳහා ජාල රේඛය නිර්මාණය කිරීමේ දී සංඛ්‍යාතය වෙනුවට සංඛ්‍යාත ඝනත්වය යොදා ගත හැකි ය.
(2) $Z$ සටහනක මුල් දත්ත නිරූපිත වක්‍රය මගින් අදාළ විචල්‍යයේ කෙටි කාලීන උච්චාවචන නිරූපණය කෙරේ.
(3) අතිච්ඡේදන රහිත පන්ති ප්‍රාන්තර ඇතුළත් සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක පන්ති සීමා හා සත්‍ය පන්ති සීමා සමාන වේ.
(4) ජාල රේඛයෙහි වර්ගඵලයත් සංඛ්‍යාත බහුඅස්‍රයෙන් වට වූ පෙදෙසේ වර්ගඵලයත් සමාන වේ.
(5) ඔගිව් මගින් ව්‍යාප්තියක අගය එකතු වීමේ ශීඝ්‍රතාව පිළිබඳ අදහසක් ලබා ගත හැකි ය.

5. පහත දැක්වෙනුයේ සමාගමක සේවකයන්ගේ වයස්වල වෘන්ත සහ පත්‍ර සටහනකි.

| වෘන්තය | පත්‍රය |
|---|---|
| 2 | 3, 4, 6, 7, 8, 8, 8, 9 |
| 3 | 2, 3, 4, 6, 7, 8, 9 |
| 4 | 1, 2, 2, 3, 4 |
| 5 | 3, 5, 6 |

ව්‍යාප්තියේ අර්ධ චතුර්ථක පරාසය වන්නේ,
(1) 14 වේ. (2) 28 වේ. (3) 7 වේ. (4) 42 වේ. (5) 28 වේ.

6. පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය අසත්‍ය වේ ද?
A. පෞද්ගලික සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ දී පිරික්සන්නා විසින් පිරික්සෙන්නා ලබා දෙන දත්ත උපලේඛනයක සටහන් කරගනු ලබයි.
B. ප්‍රශ්නාවලියක ද්විවරණ, බහුවරණ හා ඍජු පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා පිරික්සෙන්නාට සිතැඟි ආකාරයට පිළිතුරු සැපයීම කළ හැකි ය.
C. ඍජු පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා ලැබෙන පිළිතුරු මගින් නව අදහස් ලබා ගත හැකි ය.
(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

7. නිරීක්ෂණ 20 කින් සමන්විත සංගහනයක මධ්‍යන්‍ය අගය 36 ක් සහ විචලතාව 90.4 කි. 22 හා 46 ලෙස වැරදි සහගත ව වාර්තා කර ඇති නිරීක්ෂණවල නිවැරදි අගයන් පිළිවෙළින් 26 සහ 42 වන බව පසු ව හෙළි විය. දත්තයන්ට මෙම නිවැරදි කිරීම කරන්නේ නම්, එවිට පිළිවෙළින් මධ්‍යන්‍යය සහ විචලතාව වනුයේ,
(1) 28.0 සහ 82.4 වේ. (2) 36.0 සහ 82.4 වේ. (3) 36 සහ 90.4 වේ.
(4) 36 සහ 88.7 වේ. (5) 35.8 සහ 82.4 වේ.

8. සංඛ්‍යාත ව්‍යාප්තියක මධ්‍යන්‍යය මාතයට වඩා විශාල නම් මධ්‍යස්ථය, මධ්‍යන්‍යයට වඩා කුඩා වන නමුත් මාතයට වඩා විශාල නම්, ව්‍යාප්තියේ ස්වරූපය,
(1) සමමිතික වේ. (2) ධන කුටික වේ. (3) ඍණ කුටික වේ.
(4) කූට වක්‍රිම වේ. (5) විපිට වක්‍රිම වේ.

9. 7, 11, 17 11, 8 හා 12 ලෙස දී ඇති නිරීක්ෂණ සමූහය සඳහා,
(1) මධ්‍යන්‍යය මාතය ට වඩා විශාල වේ. (2) මධ්‍යස්ථය මධ්‍යන්‍යයට සමාන වේ.
(3) මාතය මධ්‍යන්‍යයට වඩා විශාල වේ. (4) මධ්‍යස්ථය මාතයට වඩා විශාල වේ.
(5) මධ්‍යස්ථය මධ්‍යන්‍යයට වඩා විශාල වේ.

10. පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?
A. වැඩි වන හෝ අඩු වන අනුපාතිකයන්ගේ සාමාන්‍යය ගැනීමේ දී වඩාත් යෝග්‍ය මිනුම වන්නේ ගුණෝත්තර මධ්‍යන්‍යය යි.
B. දකුණට කුටික ව්‍යාප්තියක් සඳහා මාතය මධ්‍යස්ථයට වඩා අඩු වන අතර මධ්‍යස්ථය මධ්‍යන්‍යයට වඩා අඩු වේ.
C. $A$ දත්ත සමූහයේ විචලන සංගුණකය $B$ දත්ත සමූහයේ විචලන සංගුණකයට වඩා විශාල නම්, $A$ දත්ත සමූහය වඩාත් සංගත වේ.
(1) $A$ පමණි. (2) $C$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

[ තුන්වෙනි පිටුව බලන්න.





11. පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය අසත්‍ය වේ ද?
A. සංඛ්‍යා රාශිය ආරෝහණ හෝ අවරෝහණ ක්‍රමයට සැකසූ පසු එම සංඛ්‍යා රාශිය සමාන කොටස් 4 කට වෙන් කෙරෙන්නා වූ ලක්ෂ්‍ය 4 චතුර්ථක ලෙස හඳුන්වයි.
B. කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්වල විශ්වාසදායී බව තිරණය කිරීම සඳහා අපකිරණ මිනුම් යොදාගත හැකි ය.
C. ධන සංඛ්‍යා දෙකක ගුණෝත්තර මධ්‍යන්‍යය සෑම විට ම ඒවායේ හරාත්මක මධ්‍යන්‍යයට වඩා විශාල වේ.
(1) $A$ පමණි. (2) $C$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $A$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

12. පහත දැක්වෙන කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?
(1) විවෘත පන්ති සහිත ව්‍යාප්තීන් හි දී කුටිකතාව ගණනය කිරීම සඳහා ප්‍රතිශතක යොදා ගත හැකි ය.
(2) කොටුකෙඳි සටහනක වම් කෙන්ද සහ දකුණු කෙන්ද මගින් දත්තවල අන්ත්‍ය අගයන්ගේ ව්‍යාප්තියේ ස්වභාවය හඳුනා ගත හැකි ය.
(3) ව්‍යාප්තීන් දෙකක මධ්‍යන්‍යයන් සමාන වන්නේ නම් එම ව්‍යාප්තීන් හි සංගතතාවන් ද සමාන වේ යැයි කිව හැකි ය.
(4) සියලු ම අයිතමවලට ආරෝපණය කරනු ලබන භාරයන් සමාන වන විට භරිත මධ්‍යන්‍යය සමාන්තර මධ්‍යන්‍යයට සමාන වේ.
(5) විචලන සංගුණකය දත්ත ව්‍යාප්තියක ස්ථායීතාව පිළිබඳ මිනුමක් වේ.

13. $2M_d < P_{90} + P_{10}$ යන සම්බන්ධතාව පවතින ව්‍යාප්තියක් සම්බන්ධයෙන් පිළිගත හැකි ප්‍රකාශය/ප්‍රකාශ කුමක් ද?
A. වමට කුටික වූ ව්‍යාප්තියකි.
B. සමවක්‍රිමයක් සහිත ව්‍යාප්තියකි.
C. මාතය, මධ්‍යස්ථය හා මධ්‍යන්‍යයට වඩා කුඩා වූ ව්‍යාප්තියකි.
(1) $A$ පමණි. (2) $C$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

14. පහත දැක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?
A. සහසම්බන්ධතා විශ්ලේෂණයේ දී විචල්‍ය දෙක ම සසම්භාවී විචල්‍යයන් ලෙස උපකල්පනය කරනු ලැබේ.
B. $X$ සහ $Y$ අතර සහසම්බන්ධතා සංගුණකය, රේඛීය සම්බන්ධතාව පිළිබඳ මිනුමක් පමණි.
C. සහසම්බන්ධතා සංගුණකය යනු මිනුම් ඒකකයන්ගෙන් ස්වායත්ත අගයකි.
(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

15. $Y = 0.76X$ යන නිමිත ප්‍රතිපායන ආකෘතියකට අදාළ පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?
A. නිර්ණන සංගුණකයෙහි අගය 1 ක් වේ.
B. පරායත්ත විචල්‍යයේ මුළු විචලනය දෝෂ වර්ග ඓක්‍යයට සමාන වේ.
C. ප්‍රතිපායන රේඛාව මූලය හරහා ගමන් කරයි.
(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $A$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

16. සරල රේඛීය ප්‍රතිපායන විශ්ලේෂණයේ දී නිර්ණන සංගුණකය සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය අසත්‍ය වේ ද?
A. නිර්ණන සංගුණකයෙහි වර්ගය සහසම්බන්ධතා සංගුණකයට සමාන වේ.
B. නිර්ණන සංගුණකය ස්වායත්ත විචල්‍යයේ මුළු විචලනයෙන් ප්‍රතිපායන ආකෘතිය මගින් විස්තර කරනු ලබන සමානුපාතය මනිනු ලබයි.
C. නිර්ණන සංගුණකය පරායත්ත විචල්‍යයේ මුළු විචලනයෙන් ප්‍රතිපායන ආකෘතිය මගින් විස්තර කරනු ලබන සමානුපාතය මනිනු ලබයි.
(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $C$ පමණි.
(4) $A$ හා $B$ පමණි. (5) $A$ හා $C$ පමණි.

[ හතරවෙනි පිටුව බලන්න.

17. සම්භාවිතා ප්‍රවේශ පිළිබඳ ව පහත දක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. සසම්භාවී පරීක්ෂණයේ විය හැකි ප්‍රතිඵල සමභව්‍ය නොවේ නම්, ආවීර්ණ කල්පිත ප්‍රවේශය භාවිත කළ නොහැකි ය.

B. සාපේක්ෂ සංඛ්‍යාත ප්‍රවේශයේ එක් සීමාවක් වන්නේ පරීක්ෂණය පුනරාවර්ත ව සිදු කිරීමේ දී පරීක්ෂණය සිදුකරන තත්ත්වයන් වෙනස් විය හැකි වීම යි.

C. පරීක්ෂණය පුනරාවර්ත ව සිදු කළ නොහැකි වන විට පුද්ගල නිශ්‍රිත සම්භාවිතා ප්‍රවේශය වඩාත් යෝග්‍ය වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

18. $A$ සහ $B$ යනු $P(A) = r_1$, $P(B) = r_2$ සහ $P(A \cap B) = r_3$ සහිත ඕනෑ ම සිද්ධි දෙකක් නම්, $P\big(A \cup (A' \cap B)\big)'$ හි අගය වන්නේ,

(1) $1 - r_1 + r_3$ වේ. (2) $r_2 - r_3$ වේ. (3) $1 - r_1 - r_2 + r_3$ වේ.
(4) $r_1 + r_2 - r_3$ (5) $1 - r_3$ වේ.

19. සම්භාවිතාව පිළිබඳ ව පහත දක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. $A$ සහ $B$ යනු අන්‍යෝන්‍යය වශයෙන් බහිෂ්කාර සිද්ධි දෙකක් නම්, $P(A|B') = \frac{P(A)}{1-P(B)}$ වේ.

B. $A$ සහ $B$ යනු අන්‍යෝන්‍යය වශයෙන් බහිෂ්කාර සිද්ධි දෙකක් නම්, සහ මෙම සිද්ධි දෙකෙන් එකක්වත් සම්භාවිතාව ශූන්‍ය නොවේ නම්, $A$ සහ $B$ ස්වායත්ත සිද්ධි වේ.

C. අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි සියල්ල පරායත්ත වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

20. $A$ සහ $B$ යනු $P(A') = \frac{3}{4}, P(A \cap B) = \frac{1}{9}$ සහ $P(B) = D$ සහිත ස්වායත්ත සිද්ධි දෙකක් නම්, $D$ හි අගය,

(1) $\frac{4}{27}$ වේ. (2) $\frac{4}{9}$ වේ. (3) $\frac{1}{4}$ වේ. (4) $\frac{1}{9}$ වේ. (5) $\frac{3}{4}$ වේ.

21. පහත දක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. $X$ සන්තතික සසම්භාවී විචල්‍යයක් වන විට $p(X = x) = 0$ වේ.

B. සසම්භාවී විචල්‍යයක අපේක්ෂාව ඍණ අගයක් විය නොහැකි ය.

C. සසම්භාවී විචල්‍යයක විචලතාව ඍණ අගයක් විය නොහැකි ය.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

22. $X$ සඳහා මධ්‍යන්‍යය 6 සහ විචලතාව 2.4 සහිත ද්විපද ව්‍යාප්තියක් ඇත්නම් $P(X > 2)$ හි අගය,

(1) 0.0323 වේ. (2) 0.0017 වේ. (3) 0.0870 වේ.
(4) 0.9677 වේ. (5) 0.9983 වේ.

23. කිසියම් යන්ත්‍රයක් මගින් නිෂ්පාදනය කරනු ලබන අයිතමයක දෝෂ සහිත වීමේ සම්භාවිතාව 0.02 වේ. පොයිසොන් සන්නිකර්ෂණය භාවිත කරන්නේ නම්, සසම්භාවී ලෙස තෝරාගනු ලබන අයිතම 100 ක දෝෂ අයිතම එකකට වඩා අඩංගු නොවීමේ සම්භාවිතාව,

(1) $1 - 3e^{-2}$ (2) $1 - e^{-2}$ (3) $e^{-2}$ (4) $3e^{-2}$ (5) $e^{-0.02}$

24. $X$ සසම්භාවී විචල්‍යයට මධ්‍යන්‍යය 20 සහ විචලතාව $\sigma^2$ සහිත ප්‍රමත ව්‍යාප්තියක් ඇත. $P(X > 22) = 0.0228$ නම්, $P(20 < X < 21)$ හි අගය වන්නේ,

(1) 0.1587 ය. (2) 0.3413 ය. (3) 0.5772 ය. (4) 0.8413 ය. (5) 0.9772 ය.

[ පස්වෙනි පිටුව බලන්න.



සංඛ්‍යාන සරණිය මාර්තු - 2022

AL/2021/31/S-I

25. පහත දක්වෙන ද්විපද ව්‍යාප්තීන් සඳහා ප්‍රමත ව්‍යාප්තිය වඩා හොඳ සන්නිකර්ෂණයක් සපයන්නේ කුමන ව්‍යාප්තිය සඳහා ද?

(1) $n = 100$ සහ $P = 0.02$ (2) $n = 100$ සහ $P = 0.05$ (3) $n = 100$ සහ $P = 0.5$
(4) $n = 100$ සහ $P = 0.95$ (5) $n = 100$ සහ $P = 0.98$

26. පහත දැක්වෙන ඒවායින් කුමක් අසත්‍ය වේ ද?

(1) සසම්භාවී නොවන නියැදීමක දී නිමානකයන්ගේ සම්මත දෝෂය ගණනය කළ නොහැකි ය.

(2) පොකුර තුළ විචලනය වැඩි වන විටත්, පොකුරු සමජාතීය වන විටත් පොකුරු නියැදීම වඩාත් කාර්යක්ෂම වේ.

(3) ස්ථර අතර විචලනය වැඩි වන විටත්, ස්ථර තුළ ඒකකයන් සමජාතීය වන විටත් ස්තෘත සසම්භාවී නියැදීම වඩා කාර්යක්ෂම වේ.

(4) පොකුරු වශයෙන් කාණ්ඩ කිරීම යනු කාණ්ඩයක් තුළ වැඩි විචලනයක් පවතින ලෙසත්, කාණ්ඩ අතර අඩු විචලනයක් පවතින ලෙසත් සංගහනයක් කොටස්වලට බෙදීම යි.

(5) චක්‍රීය ක්‍රමවත් නියැදීමේ දී මුල් ම නියැදි ඒකකය පළමු පන්ති ප්‍රාන්තරයෙන් සරල සසම්භාවී ව තෝරා ගනී.

27. පහත දක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. නියැදි මධ්‍යන්‍යය $\bar{X}$ සංගහන මධ්‍යන්‍යය $\mu$ සඳහා අනභිනත නිමානකයක් වන නිසා $\bar{X}^2$ යනු $\mu^2$ සඳහා අනභිනත නිමානකයක් වේ.

B. නියැදි සම්මත අපගමනය සංගහන සම්මත අපගමනය සඳහා අනභිනත නිමානකයක් වේ.

C. නියැදි තරම $n \to \infty$ වීමේ දී $Var(\hat{\theta}) \to 0$ නම්, $\hat{\theta}$ යනු $\theta$ සඳහා සංගත නිමානකයක් වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $C$ පමණි. (3) $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

28. පහත දක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. අධ්‍යයනයට අදාළ සංගහනයේ කිසියම් ලාක්ෂණිකයකට අදාළ ව ලැබිය හැකි සියලු ම අගයන්ගේ සම්භාවිතා ව්‍යාප්තිය සංගහන ව්‍යාප්තිය ලෙස සලකනු ලැබේ.

B. අධ්‍යයනයට අදාළ සංගහනයෙන් නියැදියක් තෝරා ගත් විට එම නියැදියේ අධ්‍යයනය කරන ලාක්ෂණිකයේ අගයන් සඳහා ලැබෙන විවිධ අගයන්ගේ සම්භාවිතා ව්‍යාප්තිය නියැදුම් ව්‍යාප්තිය ලෙස සලකනු ලබයි.

C. යම් සංගහනයකින් සමාන තරමින් යුතු ව සසම්භාවී ව ලබා ගන්නා සියලු ම නියැදිවල යම් සංඛ්‍යාතියකට අදාළ සම්භාවිතා ව්‍යාප්තිය එම සංඛ්‍යාතියේ නියැදුම් ව්‍යාප්තිය ලෙස හඳුන්වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

29. පහත දක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. විචලතාව නොදන්නා ප්‍රමත සංගහනයකින් ලබාගන්නා ලද කුඩා නියැදියක් මඟින් සංගහන මධ්‍යන්‍යය සඳහා විශ්‍රම්භ ප්‍රාන්තරයක් $t$ ව්‍යාප්තිය ඇසුරින් ගොඩනැගිය හැකි ය.

B. $t$- ව්‍යාප්තියෙහි වල්ගවල, සම්මත ප්‍රමත ව්‍යාප්තියෙහි වල්ගවලට වඩා වැඩි සම්භාවිතාවක් අඩංගු වේ.

C. $t$- ව්‍යාප්තිය දකුණට කුටික ව්‍යාප්තියක් වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

30. සංගහන මධ්‍යන්‍යය සඳහා වන විශ්‍රම්භ ප්‍රාන්තරයක් පිළිබඳ ව පහත දක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. අනෙකුත් සියලු දෑ නොවෙනස් ව පවතී නම්, 95% විශ්‍රම්භ ප්‍රාන්තරයක් 99% විශ්‍රම්භ ප්‍රාන්තරයකට වඩා පළල් වනු ඇත.

B. අනෙකුත් සියලු දෑ නොවෙනස් ව පවතී නම්, තරම 50 වූ නියැදියක් මත පදනම් වූ විශ්‍රම්භ ප්‍රාන්තරයකට වඩා තරම 100 වූ නියැදියක් මත පදනම් වූ විශ්‍රම්භ ප්‍රාන්තරයක් පටු වනු ඇත.

C. නිමානකයේ අගයට සම්භාවී දෝෂය එකතු කිරීමෙන් හා අඩු කිරීමෙන් පරාමිතියක් සඳහා විශ්‍රම්භ ප්‍රාන්තරයක් ලබාගත හැකි ය.

(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

[ හයවෙනි පිටුව බලන්න.

31. දෙන ලද වෙසෙසියා මට්ටමක දී $H_0: \mu = 15, H_1: \mu \neq 15$ ට එරෙහි ව පරීක්ෂා කිරීමට ඔබට අවශ්‍ය ව ඇතැයි සිතන්න. මෙම පරීක්ෂාව හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. $p -$ අගය භාවිතයෙන් මෙම පරීක්ෂාව කළ හැකි ය.
B. අවධි අගය සහ පරීක්ෂා සංඛ්‍යාතියේ අගය භාවිතයෙන් මෙම පරීක්ෂාව සිදු කළ හැකි ය.
C. විශ්‍රම්භ ප්‍රාන්තරයක් භාවිතයෙන් පරීක්ෂාව සිදු කළ හැකි ය.

(1) $A$ පමණි. (2) $B$ පමණි. (3) $A$ සහ $B$ පමණි.
(4) $A$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

32. $N(\mu, 100)$ ව්‍යාප්තියෙන් ලබාගන්නා ලද තරම 16 වන සසම්භාවී නියැදියක මධ්‍යන්‍යය $\bar{X} = 247.5$ ලෙස ලැබුණි. $H_0: \mu = 250$ කල්පිතය $H_1: \mu < 250$ කල්පිතයට එරෙහිව පරීක්ෂා කිරීමේ දී $P -$ අගය වන්නේ,

(1) 0.1587 ය. (2) 0.1706 ය. (3) 0.3413 ය.
(4) 0.6286 ය. (5) 0.6826 ය.

33. කල්පිත පරීක්ෂාව සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. කල්පිතය සත්‍ය වන විට සංගහන සම්භාවිතා ව්‍යාප්තිය සම්පූර්ණයෙන් ම තීරණය වේ නම්, එම කල්පිතය සරල කල්පිතයක් වේ.
B. අඩු පළමු ප්‍රරූපයේ දෝෂයක් සහිත කල්පිත පරීක්ෂාවක් වැඩි පළමු ප්‍රරූපයේ දෝෂයක් සහිත කල්පිත පරීක්ෂාවට වඩා නිතර ම හොඳ එකක් වේ.
C. කල්පිත පරීක්ෂාවක $p -$ අගය අභිශූන්‍ය කල්පිතයේ විශ්වාසනීයත්වය පිළිබඳ මිනුමක් වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

34. පහත දැක්වෙන කුමන ප්‍රකාශය සත්‍ය වේ ද?

(1) කල්පිත පරීක්ෂාවක දී දෙවන ප්‍රරූපයේ දෝෂය වඩාත් බරපතල දෝෂය ලෙස සැලකේ.
(2) පරීක්ෂා සංඛ්‍යාතියේ නියැදුම් ව්‍යාප්තිය භාවිත කිරීමෙන් වුව ද විශ්‍රම්භ ප්‍රාන්තරයක් ගොඩනැගිය හැකි ය.
(3) අභිශූන්‍ය කල්පිතය සත්‍ය වේ ය යන උපකල්පනය යටතේ පරීක්ෂා සංඛ්‍යාතිය අර්ථ දක්වනු ලැබේ.
(4) පරීක්ෂාවක බලය පළමු ප්‍රරූප දෝෂයට සම්බන්ධිත වේ.
(5) පරීක්ෂාවක් සඳහා $p -$ අගය 0.014 නම් 5% මට්ටමේ දී මෙන් ම 1% මට්ටමේ දී ද $H_0$ කල්පිතය පිළිගත හැකි ය.

35. පහත දැක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. ප්‍රමත ව ව්‍යාප්ත වූ සංගහනයකින් ලබා ගත් සසම්භාවී නියැදි දත්තවල විචලතාව කයිවර්ග ව්‍යාප්ත වේ.
B. වෛකල්පිත කල්පිතය සත්‍ය වන විට එය වෛකල්පිත කල්පිතය පිළිගැනීමේ සම්භාවිතාව පරීක්ෂාවේ බලය නම් වේ.
C. දකුණු වල්ග පරීක්ෂාවක $p -$ අගය පරීක්ෂා සංඛ්‍යාතියේ අගයට වම් පැත්තේ වර්ගඵලයට සමාන වේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

36. $N(\mu, 81)$ සංගහනයෙන් තරම 36 වන නියැදියක් මඟින් $H_0: \mu = 96$ යන කල්පිතය $H_1: \mu = 99$ යන කල්පිතයට එරෙහිව පරීක්ෂා කරනු ලැබේ. $\overline{X} > 98.46$ නම් $H_0: \mu = 96$ යන කල්පිතය ප්‍රතික්ෂේප කිරීමෙන් පරීක්ෂණ ක්‍රියාවලිය සමන්විත වේ. මෙම පරීක්ෂාවේ පිළිගැනුම් පෙදෙසෙහි සම්භාවිතාව කොපමණ ද?

(1) 0.3594 (2) 0.0505 (3) 0.9405 (4) 0.05 (5) 0.6406

37. පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. තනි වල්ග හෝ ද්වි වල්ග පරීක්ෂාවක් කරන්නේ ද යන්න තීරණය කිරීම අභිශූන්‍ය කල්පිතයේ ස්වරූපය මත රඳා පවතී.
B. නියත නියැදි තරමක් තුළ කල්පිත පරීක්ෂාවක දී පළමු ප්‍රරූපයේ දෝෂය සහ දෙවන ප්‍රරූපයේ දෝෂය යන දෙක ම එකවර අවම කළ නොහැකි ය.
C. 5% ක වෙසෙසියා මට්ටමේ කල්පිත පරීක්ෂාවක දී $p -$ අගය $< 0.05$ නම්, $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප කරනු නොලැබේ.

(1) $A$ පමණි. (2) $C$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

[ හත්වෙනි පිටුව බලන්න.





38. පහත දැක්වෙන සංඛ්‍යාත ව්‍යාප්තිය සඳහා පොයිසෝන් ව්‍යාප්තියක් අනුසීහුමය කරන ලදී. 5% මට්ටමකින් අනුසීහුමයේ හොඳකම පරීක්ෂා කිරීමේ දී අවධි අගය වන්නේ,

| අංකය | 0 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|---|
| සංඛ්‍යාතය | 36 | 25 | 16 | 10 | 6 | 4 | 2 | 1 |

(1) $\chi^2 = 9.49$ ය. (2) $\chi^2 = 11.1$ ය. (3) $\chi^2 = 7.82$ ය.
(4) $\chi^2 = 12.6$ ය. (5) $\chi^2 = 14.4$ ය.

39. විචලතා සමාන, ප්‍රමත සංගහන හතරක මධ්‍යන්‍යයන් සංසන්දනය කිරීම සඳහා ගොඩනගන ලද විචලතා විශ්ලේෂණ වගුවක දෝෂ වර්ගයන්ගේ එකතුවට අදාළ සුචලන අංකය 16 ක් විය. 2.5% මට්ටමකින් මධ්‍යන්‍යයන් සමාන දැයි පරීක්ෂා කිරීමේ දී අවධි අගය වන්නේ,

(1) 4.08 ය. (2) 4.15 ය. (3) 3.86 ය.
(4) 6.12 ය. (5) 8.56 ය.

40. මූලය 2000 සහිත $Y_t = 125 + 3t$ උපනති සමීකරණය ඔබට දී ඇත. කාල ඒකකය $=$ වර්ෂ 1 කි. මූලය 2013 ට විතැන් කරන්නේ නම් නව උපනති සමීකරණය,

(1) $Y_t = 138 + 3t$ වේ. (2) $Y_t = 125 + 13t$ වේ. (3) $Y_t = 164 + 3t$ වේ.
(4) $Y_t = 164 + 39t$ වේ. (5) $Y_t = 125 + 3t$ වේ.

41. සමාගමක අලෙවිය අප්‍රේල් මාසයෙහි රු. 60 000 සිට මැයි මාසයෙහි රු. 35 000 දක්වා අඩු විය. මෙම මාස දෙක සඳහා ආර්තව දර්ශක පිළිවෙළින් 120 සහ 95 වේ. මැයි මාසයෙහි අලෙවිය පිළිබඳ ව සමාගම් අයිතිකරු කිසිසේත් සෑහිමකට පත් වී නැත. එම මාසය සඳහා ආර්තව දර්ශකය අනුව ඔහු මෙයට වඩා අලෙවියක් බලාපොරොත්තු විය. මැයි මාසය සඳහා අලෙවියෙහි ඔහුගේ ඇස්තමේන්තු අගය කුමක් වී ද?

(1) රු. 45000 (2) රු. 47500 (3) රු. 57000
(4) රු. 50000 (5) රු. 55000

42. ආර්තව සංරචකය නිමානය කිරීමේ ක්‍රියාවලියේ දී කාලශ්‍රේණි අගයන් කේන්ද්‍රික චල මධ්‍යයකවලින් බෙදූ විට කුමන සංරචක ඉවත් වේ ද?

(1) $S$ සහ $I$ (2) $T$ සහ $C$ (3) $S, C$ සහ $I$ (4) $T, C$ සහ $I$ (5) $T, S$ සහ $I$

43. වර්තන වර්ෂයේ දී භාණ්ඩ මිල ගණන්වල ඓක්‍යය පාද වර්ෂයේ දී අනුරූප භාණ්ඩ මිල ගණන්වල ඓක්‍යයට දරන ප්‍රතිශතයට කියනු ලබන්නේ,

(1) මිල සාපේක්ෂකයන්ගේ හරිත සාමාන්‍යය ය. (2) හරිත සමාහාර මිල දර්ශකය ය.
(3) සරල සාමාන්‍ය මිල දර්ශකය ය. (4) සරල සමාහාර මිල දර්ශකය ය.
(5) සරල සමාහාර ප්‍රමාණ දර්ශකය ය.

44. පහත දැක්වෙන දර්ශක පිළිබඳ ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

A. ෆිෂර්ගේ දර්ශකය කාල ප්‍රතිවර්ත පරීක්ෂාව සහ සාධක ප්‍රතිවර්ත පරීක්ෂාව යන දෙක ම තෘප්ත කරන නිසා එය පරිපූර්ණ දර්ශකයක් ලෙස සලකනු ලැබේ.
B. සරල සාපේක්ෂකයන්ගේ සාමාන්‍ය දර්ශකය මිනුම් ඒකකවලින් ස්වායත්ත වේ.
C. පදනම් වර්ෂයේ ප්‍රමාණයන් භාර වශයෙන් ගෙන ලබාගන්නා වර්තන වර්ෂයේ මුළු වියදම පදනම් වර්ෂයේ මුළු වියදමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ විට ලැබෙන අගයට ලැස්පියර්ගේ පාරිභෝගික මිල දර්ශකය යැයි කියනු ලැබේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

45. ෆිෂර් සහ පාෂේ මිල දර්ශකයන් පිළිවෙළින් 225 සහ 250 වේ නම් ලැස්පියර් මිල දර්ශකයෙහි අගය වනුයේ,

(1) 90 (2) 111.1 (3) 202.5 (4) 237.1 (5) 277.7

[ අටවෙනි පිටුව බලන්න.

46. පාද වර්ෂයේ භාණ්ඩ පැසක් සඳහා දෙන ලද වර්ෂයෙහි මුළු වියදම පාද වර්ෂයෙහි මුළු වියදමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කළ විට ලැබෙන දර්ශකයට කියනු ලබන්නේ

(1) අගය දර්ශකය යි. (2) පාෂේගේ මිල දර්ශකය යි. (3) ලැස්පියර්ගේ මිල දර්ශකය යි.
(4) සරල සමාහාර මිල දර්ශකය යි. (5) සරල මිල දර්ශකය යි.

47. පහත දැක්වෙන කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

*A*. දෝෂ සහිත අමුද්‍රව්‍ය භාවිතය සම්භාවනා විචලනයෙහි හේතුවක් සඳහා නිදසුනක් වේ.
*B*. පාලන සටහනක් මගින් තොගයක් පිළිගත යුතු ද ප්‍රතික්ෂේප කළ යුතු ද යන්න නිර්ණය කරනු ලැබේ.
*C*. $C-$ සටහන සඳහා $3\sigma$ පාලන සීමා පොයිසෝන් ව්‍යාප්තියක් පදනම් කරගෙන ගොඩනගනු ලබයි.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ පමණි. (5) $C$ පමණි.

48. විදුලි බල්බ නිෂ්පාදකයෙක් සදොස් බල්බ සඳහා පරීක්ෂා කිරීමට එක් එක් වැඩ මුරයක් අවසානයේ බල්බ 36 කින් යුත් සසම්භාවී නියැදි තෝරා ගනී. වැඩ මුර 25 ක දී ලැබූ මුළු සදොස් බල්බ සංඛ්‍යාව 90 ක් විය. $np-$ සටහනෙහි ඉහළ පාලන සීමාව වන්නේ,

(1) 7 ය. (2) 5.4 ය. (3) 9 ය. (4) 5.5 ය. (5) 0.305 ය.

49. තත්ත්ව පාලනයේ දී මෙහෙයුම් ලාක්ෂණික වක්‍රය භාවිත කරන්නේ,

(1) තොග ගුණත්වය නිමානය කිරීමට ය.
(2) ක්‍රියාවලිය පාලනය කර ගුණත්වය ක්‍රමානුකූල ව වැඩි දියුණු කිරීම සඳහා ය.
(3) පිළිගැනුම් නියැදි සැලැස්මක යෝග්‍ය බව ඇගයීම සඳහා ය.
(4) තොගය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තීරණයක් ගැනීම සඳහා ය.
(5) සැපයුම්කරුට විශිෂ්ට ගුණත්ව ඉතිහාසයක් ඇත් දැයි තහවුරු කිරීමට ය.

50. නිෂ්පාදන පාලනය පිළිබඳ ව පහත දැක්වෙන ප්‍රකාශවලින් කුමන ප්‍රකාශ/ප්‍රකාශය සත්‍ය වේ ද?

*A*. නියැදුම් සැලැස්මක කාරක ලාක්ෂණික වක්‍රයක් යනු තොගයක සදොස් භාගයෙහි විවිධ අවස්ථා සඳහා පිළිගැනුම් සම්භාවිතාවෙහි ප්‍රස්තාරික නිරූපණයක් වේ.
*B*. තොග සහන ප්‍රතිශත සදොස් ප්‍රමාණය ($LTPD$) යනු පාරිභෝගිකයා විසින් හොඳ යැයි සලකනු ලබන ගුණත්වය වේ.
*C*. තනි නියැදුම් සැලැස්මක දී නියැදිය තුළ ඉඩ හරිනු ලබන උපරිම දෝෂ සංඛ්‍යාව පිළිගැනුම් සංඛ්‍යාව ලෙස හඳුන්වනු ලැබේ.

(1) $A$ පමණි. (2) $A$ සහ $B$ පමණි. (3) $A$ සහ $C$ පමණි.
(4) $B$ සහ $C$ පමණි. (5) $A, B$ සහ $C$ සියල්ල ම ය.

❊❊❊

වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින
දැන් ඒවි තැනි බිමට - සීතල යි මගෙ සිතට
වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න
ඔබ එන්න - ඉතින් මගෙ හෙට දවස මට දෙන්න

ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව
ඇදි ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය
දුෂ්කර ය කියා හැර යා යුතු ද ජීවිතය?
කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස

- වස්සානේ (රත්න ශ්‍රී විජේසිංහ)







පි
ළි
තු
රු

පි
ටු
ව

## දැනුමට බිඳක්

01. Facebook
02. 67.9%
03. Bitcoin
04. වේගා (Vega)
05. කොළඹ විශ්වවිද්‍යාලය (University of Colombo)
06. Apple
07. ඔලිවර් ඩේමන් (Oliver Daemen)
08. එක්සත් ජනපදය (United States)
09. Kapruka
10. ICTA

## Puzzle



1. Innovations
2. Machinery
3. Social Media
4. Telecommunication
5. SPSS
6. Electronics
7. Robotics
8. High Tech
9. Virtual Reality
10. Minitab
11. Crypto currency
12. Computing





## සිහිනයට අත්වැලක් උපකාරක සම්මන්ත්‍රණ ප්‍රශ්න පත්‍රය

01. ගුණාත්මක දත්ත, කිරුම්, මිනුම්, ගණන කිරීම් මගින් මෙන් ම නිරීක්ෂණය කිරීමෙන් ලබාගත හැකි ය.
02. A, B සහ C සියල්ලම ය.
03. A, B සහ C සියල්ලම ය.
04. අතිච්ඡේදන රහිත පන්ති ප්‍රාන්තර ඇතුළත් සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක පන්ති සීමා හා සත්‍ය පන්ති සීමා සමාන වේ.
05. 7 වේ.
06. B සහ C පමණි.
07. 36.0 සහ 82.4 වේ.
08. ධන කුටික වේ.
09. මධ්‍යස්ථය මධ්‍යනයට සමාන වේ.
10. A සහ B පමණි.
11. A සහ C පමණි.
12. ව්‍යාප්තීන් දෙකක මධ්‍යනයන් සමාන වන්නේ නම් එම ව්‍යාප්තීන් හි සංගතතාවයන් ද සමාන වේ යැයි කිව හැකි ය.
13. C පමණි.
14. A, B සහ C සියල්ලම ය.
15. A, B සහ C සියල්ලම ය.
16. A සහ B පමණි.
17. A, B සහ C සියල්ලම ය.
18. $1 - r_1 - r_2 + r_3$ වේ.
19. A සහ C පමණි.
20. 4/9 වේ.
21. A සහ C පමණි.
22. 0.9877 වේ.
23. $3e^{-2}$
24. 0.3413 ය.
25. n=100 සහ P=0.5
26. චක්‍රීය ක්‍රමවත් නියැදීමේ දී මුල්ම නියැදි ඒකකය පළමු පන්ති ප්‍රාන්තරයෙන් සරල සසම්භාවී ව තෝරා ගනී.
27. C පමණි.
28. A සහ C පමණි.
29. A සහ B පමණි.
30. B සහ C පමණි.
31. A, B සහ C සියල්ලම ය.
32. 0.1587 ය.
33. A සහ C පමණි.
34. අභිශූන්‍ය කල්පිතය සත්‍ය වේ ය යන උපකල්පනය යටතේ පරීක්ෂා සංඛ්‍යාතිය අර්ථ දක්වනු ලැබේ.
35. A සහ B පමණි.
36. 0.9495 වේ.
37. B පමණි.
38. $\chi 2 = 7.82$ ය.
39. 4.08 ය.
40. Yt = 164 + 3t වේ.
41. රු. 47500
42. T සහ C
43. සරල සමාහාර මිල දර්ශකය ය.
44. A, B සහ C සියල්ලම ය.
45. 202.5
46. ලැස්පියර්ගේ මිල දර්ශකය යි.
47. C පමණි.
48. 9 ය.
49. පිළිගැනුම් නියැදි සැලැස්මක යෝග්‍ය බව ඇගයීම සඳහා ය.
50. A සහ C පමණි.

# ස්ටැටි පොඩ්ඩා


සර්, අපිව එක්කන් යනවා කියුව ට්‍රිප් එක යන්නෙ කවදාද ?
මමම.... සැලසුම් කරපු විදිහට නියමිත දවසට යන්න බැරිවෙයි පුතාලා.
අනේ...
ඉතින් සර් අපිට virtual visit එකක් යන්න පුලුවන්නේ. දැන් ලෝකෙ තියෙන හුගක් දේවල් සජීවී විදිහටම බලන්න තරම් තාක්ෂණය දියුණුවෙලා තියෙනවා.
ග්‍රහලෝකාගාරයට ගිහින් සැබෑ අත්දැකීමක් ලබනවා වගේ ආදේශයක් මේක.
එතකොට දැන් අපි භාවිත කරන Data Analysis වලට අලුත් තාක්ෂණික මෙවලම් නැද්ද පොඩ්ඩා ?
මේවාට අවශ්‍ය කරන Technical Devices වෙනත් රටවල දැනටමත් හුගක් භාවිත කරනවා.
Brain Computer Interface කියන තාක්ෂණය එක්ක Develop කරලා තියෙනවා තවත් අලුත් Analysis Tools රාශියක්.
මමම....


ඒකෙදි වෙන්නෙ මහාචාර්යතුමා, මොලයේ නියුරෝන සහ Digital Device එකක් සම්බන්ධ කරලා අපේ මොලේ මගින් අදාළ මෘදුකාංගය හෝ උපාංගය තමන්ට අවශ්‍ය විදිහට ක්‍රියාත්මක කරන්න පුලුවන් තාක්ෂණයක් ...
අපි හිතවාට වඩා අලුත් පරපුර තාක්ෂණික වේගයෙන් ඉස්සරහට යනවා.
ඒත් ඉතින් ලැබෙන සංඛ්‍යා දත්ත එක්ක බැලුවම පේන්න තියෙන්නෙ බහුතරයක් Social Media එක්ක නිකරුණේ කාලය ගත කරනවා කියලා.
සුදුසු දේ සුදුසු විදිහට පාවිච්චි කරනවානම් Social Media වලිනුත් හොඳ දැනුවත්භාවයක් ගන්න පුලුවන්.
දැන් තාක්ෂණය එක්ක E-Business, E-Banking, E-Course වගේ ගොඩක් දේවල්වලට මේ තාක්ෂණය යොදා ගන්න පුලුවන්.
අන්න හරි. හර බැර ධණ සෘණ වගේ හැම දෙයක්ම තුලිත කරගෙන යනවා නම් වඩා හොදයි.



ප්‍රකාශනය
විෂය සංගමය
සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ISSN 2756-9012

මුද්‍රිත අනුවාදය 2756-9004